# ශ්‍රී ලාංකේය සමාජයේ අලි - මිනිස් ගැටුම ගැටුම්වාදී විශ්ලේෂණයක් මගින් අර්ථකථනය කිරීම

කීර්ති ජයවර්ධන[1], සරත් අමරසිංහ[2], එන්.වී.ජී.ඒ. හේමන්ත කුමාර[3]
සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර
[1]keerthi@nisd.ac.lk

**සංක්ෂේපය**

ශ්‍රී ලාංකේය ජන සමාජයෙහි තිරසාර නොවන සංවර්ධන, දේශපාලන හා පාරිසරික ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීමේ ඌනන, ජනගහන වර්ධනය, නව ලිබරල් ධනවාදය මෙන් ම යටත්විජිතකරණය මානව හා සත්ව ප්‍රජාව අතර ගැටුම් නිර්මාණය වීමට හේතු විය. පාරිසරික ප්‍රතිලාභ මානවයා හා සත්ව ප්‍රජාව අතර තුලනාත්මක ව බෙදී නොයාමත්, සංකීර්ණ මානව අවශ්‍යතා ඉටු කිරීමට ප්‍රමාණවත් ස්වාභාවික සම්පත් වර්ධනය නොවීමත්, එම සම්පත් මානව ක්‍රියාකාරකම් සඳහා පූර්ණ උපයෝජනය කිරීමත් හේතුවෙන් ගැටුම විවිධ දිශානතිවලට යොමු වීමක් දැකිය හැකි ය. අලි - මිනිස් ගැටුම මෙවැනි පාරිසරික ප්‍රතිලාභ අසමමිතික ව බෙදී යාම මත පදනම් වු දිග්ගැස්සුණු සමාජ ගැටුමකි. මානව හා සත්ව ප්‍රජාවගේ අවශ්‍යතා අතර සට්ටනීය අසමබරතාව ගැටුමේ පූර්වෝක්ති සාධක වී ඇති බව අනාවරණය කළ හැකි ය. එහෙයින් මෙම පර්යේෂණ ලිපිය මගින් ගැටුමේ ගැඹුරු සාධක, එම සාධක මානවයා හා සත්ව ප්‍රජාව අතර අත්පත් කර ගැනීමේ දී පවතින ගැටලු හඳුනා ගැනීම මගින් න්‍යායාත්මක සාධක කේන්ද්‍ර කරගනිමින් ගැටුම් පර්යායයක් මගින් විශ්ලේෂණය කිරීම සිදු කරන ලදි. අධ්‍යයනය සඳහා මිශ්‍ර ක්‍රමවේදය භාවිත කිරීම සිදු විය. ප්‍රමාණාත්මක දත්ත ඒකරාශී කිරීම සඳහා ප්‍රශ්න මාලාව උපයෝගී කර ගත් අතර ගුණාත්මක දත්ත කේන්ද්‍රගත සම්මුඛ සාකච්ඡා හා ප්‍රත්‍යක්ෂ දත්ත මත පදනම් විය. සසම්භාවී නියැදිය යටතේ ස්තෘත නියැදිය භාවිත කළ අතර සමස්ත නියැදිය 322ක් විය. ප්‍රත්‍යක්ෂ අධ්‍යයන 2ක් හා කේන්ද්‍රගත සම්මුඛ සාකච්ඡා 3ක් අධ්‍යයනය සඳහා උපයෝගී කර ගැනුණි. පර්යේෂණයේ අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස මොනරාගල දිස්ත්‍රික්කයේ තණමල්විල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හම්බෙගමුව හා හම්බෙගමුව ජනපදය යන ග්‍රාමනිලධාරී වසම් දෙක උපයෝගී කරගන්නා ලදි. ගැටුමෙහි අනන්‍යතා සාධක අතර තුලනාත්මක සම්බන්ධතා අසමතුලිත ආකාරයෙන් බෙදී යාමත් පරිසර ප්‍රතිලාභ මානව කේන්ද්‍රීය සාධක මත පදනම් වීම ගැටුම තුළ අනාවරිත සාධක වේ. මේ හේතුවෙන් සම්පත් අත්පත් කර ගැනීම මානවයා මත පදනම් වීම හෙජමොනික් ගැටුමක් බවට පත් වී ඇත. මෙය මානව ජන ජීවිතයේ ප්‍රාථමික හා ද්විතීයික අවශ්‍යතා ද්විත්වය කෙරෙහි ම තීව්‍ර සාධක වී ඇති බව අනාවරණය කර ගත හැකි විය. විශේෂයෙන් ම දෛනික පරිභෝජන අවශ්‍යතා ඉටු කර ගැනීමේ දී මෙන් ම ස්වයංසාධිත තත්ත්ව සාධනය කර ගැනීමේ සිට ප්‍රජනන පවුල බිහි කර ගැනීමේ කාල සීමා පටු වීම දක්වා ගැටුම පරාසගත වී ඇති බව අනාවරණය විය. මේ හේතුවෙන් ගැටුම සම්පූර්ණයෙන් ම වැළැක්වීමකට වඩා

සමථන කාර්යයක් මගින් විසඳුම් ක්‍රියාවලියක් සඳහා යොමු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සකස් කළ යුතු ආකාරය අධ්‍යයන දත්ත මගින් අනාවරණය කර ඇත.

**මුඛ්‍ය පදඃ- අලි -** මිනිස් ගැටුම, කෘෂි ගොවි පවුල, පාරිසරික ප්‍රතිලාභ, මානව කේන්ද්‍රීයකරණය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය

## Abstract

Unsustainable development, lack of implementation of political and environmental policies, population growth, neoliberal capitalism as well as colonization in the Sri Lankan society have resulted in conflicts between the human and animal community. Due to the facts that the environmental benefits are not proportionally distributed between the human and the animal community, the natural resources are not developed enough to fulfill the complex human needs, and the resources are fully utilized for human activities, this conflict can be seen moving in different directions. Elephant-human conflict is a protracted social conflict based on the asymmetric distribution of such environmental benefits. It can be revealed that conflicting imbalance between the needs of human and animal community has been the main cause of the conflict. Therefore, this research article examined the deep factors of the conflict, the problems existing in the acquisition of those factors between the human and the animal community by focusing on the theoretical factors through a conflict analysis. A mixed methodology was used for the study. Questionnaires were used to collect quantitative data and qualitative data were collected through focus interviews. Besides, stratified sampling was used under random sampling and the total sample was 322. Moreover, 2 case studies and 3 focus Group interviews were used for the study. The villages, Hambegamuwa and Hambegamuwa Colony, in the Thanamalwila Regional Secretariat Division of the Monaragala District were used as the field of study of the research. Identified factors in the conflict include imbalance between relationships and the disparity of distribution of environmental benefits based on anthropocentric factors. Due to this, human-based resource acquisition has become a hegemonic conflict. It was revealed that this has been an intensive factor on both the primary and secondary needs of human life. That is, the conflict has ranged from achieving self-sufficiency, especially in fulfilling daily consumption

needs, to creating a reproductive family due to inadequate time. Accordingly, the data stress that a solution should be sought more from a reconciliation process rather than attempting to completely prevent the conflict.

**Keywords: -** Elephant - Human Conflict, Agro-Farmer Family, Environmental Benefits, Anthropocentrism, Domestic Violence

**හැඳින්වීම**

ශ්‍රී ලාංකේය ජන සමාජය විවෘත ආර්ථිකයට බද්ධ කිරීමත් සමග සමාජ, ආර්ථික හා සංස්කෘතික වශයෙන් සෑම අංශයක ම පරිවර්තනයක් සිදු විය. එනම්, පුද්ගලයාගේ පරිභෝජනය, සහසම්බන්ධතා රටාව, ජනාවාසකරණය හා ආකල්ප රටාව ආදි සෑම අංශයක ම පෙර පැවති සරල ආර්ථික ක්‍රමයකට වඩා වෙනසියාවකට ලක් විය (ජයකොඩි, 2007). විශේෂයෙන් ම මානවයා මෙම ක්‍රියාකාරකම් රටාව කේන්ද්‍රය කරගනිමින් නව ජීවන රටා නිර්මාණය කර ගැනීමට වඩාත් උත්සුක විය. එහි ප්‍රතිඵලය වූයේ මානව ක්‍රියාකාරීත්වය ආත්මාර්ථය උදෙසා සංවිධානය වීම යි. අතීතයේ මානව සමාජය ස්වාභාවික පරිසරය සමග බද්ධ වී තිබුණි. සිය දෛනික අවශ්‍යතා තමා අවට පරිසරයෙන් සපයා ගත් අතර පරිසරය සමග සන්නිවේදනය ද සිදු විය. එනම්, පුද්ගලයාගේ ජීවිතය පවත්වා ගෙන යාමට ස්වාභාවික සම්පත් ඉවහල් කර ගත් අතර එම ස්වාභාවික සම්පත් අත් කරගැනීමේ දී පරිසරයට හානිදායක නොවන ආකාරයෙන් සිදු කරන ලදි (ආරියසේන, 2004; අබේගුණවර්ධන, 2002; ආරියදාස, 2002; ධනපාල, 2006). මානව ක්‍රියාකාරකම් හා ස්වභාව ධර්මය අතර මනා තුලනයක් හෙවත් සහයෝගීතාවක් ඇති වන ආකාරයෙන් පරිසර සම්පත උපයෝගී කර ගැනුණි. එසේ ම පරිසරයට දේවත්වයක් ආරෝපණය කරමින් මානවයා ස්වාභාවික පරිසරයට හානි කිරීම අවම මට්ටමකින් පවත්වා ගෙන ගියේ ය. ස්වාභාවික පරිසරයේ පවතින අල වර්ග, සතුන් දඩයම් කිරීම හා ධාන්‍ය ආදිය මානවයාගේ ආහාරයේ මූලික කොටස් විය. මේ හේතුවෙන් මානවයා පරිසරයේ අනුයෝජනීය කොටසක් බවට පත් විය. ස්වාභාවික පරිසරයේ කොටසක් ම වූ සත්ව කොට්ඨාසය මානවයාගේ ආහාරයේ කොටසක් වුවත් ඔවුන්ගේ දෛනික කාර්යයන් හා සම්බන්ධ කර ගැනීම ද සිදු විය. අනෙක් අතට මානව අවශ්‍යතා සරල මට්ටමක පැවතීම හේතුවෙන් වන හානිය ද අවම විය. එහෙයින් සත්ව කොට්ඨාසවලට ඔවුන්ගේ නිජබිම් ආරක්ෂා කර ගැනීමටත් එම නිජබිම්හි සත්ව චර්යා පවත්වා ගෙන යාමටත් අවශ්‍ය මූලික ඉඩකඩ විවර විය (Craves & Reavey, 1996). ගෝලීය ධනවාදී ආර්ථිකය, තිරසාර සංවර්ධනය, කාර්මීකරණය හා නාගරීකරණය මානවයා පරිසරය සමග පැවති අවියෝජනීය සබඳතාව බිඳ දැමීමට හේතු විය. එනම් තරගකාරී ආර්ථික රටා පෞද්ගලිකත්වය ඉස්මතු වීම, ලාභයට මුල් තැන දීම ආදි ප්‍රධාන කාරණා මානවයා තුළ රෝපණය වීමත් සමග තත්කාලීන සහසම්බන්ධතා රටාව බිඳ වැටීමට පත් විය. විශේෂයෙන්

ම මානව ක්‍රියාකාරීත්වයන් පරිසරය විෂයෙහි විෂමාකාරයෙන් දියත් කිරීමත් සමග ගැටලු රාශියක් උද්ගත විය. භූමි හායනය, ඕසෝන් වියන සිදුරු වීම, අම්ල වැසි, පාංශු ඛාදනය ඒ අතර ප්‍රබල ගැටලු බවට පත් විය. මෙහි ප්‍රතිඵලය වූයේ මානවයා තම තරගකාරී අවශ්‍යතා ඉටු කර ගැනීමට ප්‍රමුඛත්වයක් ලබාදීම විනා පරිසරය ආරක්ෂා කිරීමට කටයුතු නොකිරීම යි. විශේෂයෙන් ම කාර්මීකරණයත් නව සංවර්ධන සංකල්ප ඉස්මතු වීමත් සමග සංවර්ධන ඉලක්ක ඉටු කර ගැනීමට මානවයා පෙලඹීමක් වූවා මිස පරිසරය හා එහි සිටින සත්ව කොට්ඨාස ආරක්ෂා කිරීමට උනන්දුවක් දැක්වීම සිදු නො වීය. අනෙක් අතින් නව සංවර්ධන ව්‍යාපෘති ග්‍රාමීය මට්ටමෙන් ස්ථාපිත වීමත් ජනගහනය වර්ධනය වීමත් සමග වනාන්තර විශාල වශයෙන් එළිපෙහෙළි විය. මෙහි ප්‍රතිඵලය වූයේ වන සත්ව කොට්ඨාස ගම්මාන කරා ඇදී ඒමත් මානවයා හා සත්ව කොට්ඨාස අතර ගැටුම් නිර්මාණය වීමත් ය.

නූතන සමාජ නවීකරණය හා නව සංවර්ධන ව්‍යාපෘතිවල ක්‍රියාකාරීත්වය මත ඇති වූ මෙවැනි එක් ගැටුමක් වනුයේ අලි - මිනිස් ගැටුම යි. විශේෂයෙන් ම වර්ධනය වන ජනගහනයට සාපේක්ෂ ව ඔවුන්ගේ නිවාස ඉදි කර ගැනීම සඳහා වනාන්තර කට්ටි වීම, සත්ව අභය භූමි ජනපදකරණයට ලක් වීම යන මූලික කාරණා හේතුවෙන් විශාල වශයෙන් වනාන්තර එළිපෙහෙළි විය. එහි ඍජු ප්‍රතිඵලය වුයේ වනාන්තරවල අලින් විසින් පරිභෝජනය කළ ආහාර පාන ආදිය නොමැති වීමෙන් ඔවුන් ගම්මානවලට සංක්‍රමණය වීම යි. මේ හේතුවෙන් වගාවන්වලට මෙන් ම ප්‍රජාවගේ නිවාස විනාශ කිරිම, මනුෂ්‍ය ඝාතන සිදු කිරිම ඇතුළු නොයෙක් ක්‍රියාවලීන් සිදු විය (Cunnigham,et al., 1993; හෙට්ටිආරච්චි, 2000). මේ තත්ත්වය ප්‍රධාන වශයෙන් ම මානවයාගේ ක්‍රියාවලිය හා බැඳී තිබුණි. එනම්, අලිමංකඩ හරස් කරමින් නොයෙක් ව්‍යාපෘති බිහි කිරීම, නිවාස ඉදි කිරීම ඇතුළු මානව ක්‍රියාකාරීත්වයන් රාශියක් ඒ යටතේ සිදු විය. මේ හේතුවෙන් මානවයාගේ ඍජු මැදිහත් වීමේ ක්‍රියාවලිය මෙවැනි ගැටුම්කාරී තත්ත්වයක් නිර්මාණය වීම කෙරෙහි බලපා ඇත. විශේෂයෙන් ම ගැටුම යන සංකල්පය දෙපාර්ශ්වයක් හෝ ඊට වැඩි ගණනක ක්‍රියාකාරීත්වය මත පදනම් වී තිබේ. එසේ ම ගැටුම වනාහී ''යම් ලාභ අපේක්ෂාවක් හැඟීම් හෝ අදහස් මත අන්‍යෝන්‍ය විරුද්ධත්වය හඟවන එදිරිවාදීකම් හා පීඩාවන් සහිත විසංවාදයක්'' ලෙස ද හැඳින්විය හැකි ය (ප්‍රනාන්දු, 2005). මේ කාරණා උක්ත පර්යේෂණ මාතෘකාව සනාථ කිරීම සඳහා යොදා ගැනීම යෝග්‍ය වේ. එනම් ගැටුමට සම්බන්ධ මානව හා සත්ව කොට්ඨාසය ඔවුනොවුන්ගේ අවශ්‍යතා සන්තර්පණය කිරීම විෂයෙහි ගැටුමකට මුහුණ දී සිටිති. මේ තත්ත්වය ඔවුනොවුන්ගේ ක්‍රියාවලිය හා බැඳී පවතින අතර එකිනෙකාගේ දුක්ගැනවිලි ගැටුමෙහි අන්තර්ගත වී ඇත. එහෙයින් ගැටුමට මුහුණ දෙන දෙපාර්ශ්වයේ අවශ්‍යතා හා අනන්‍යතා අලි - මිනිස් ගැටුම තුළ තීව්‍ර වී ඇත. මේ හේතුවෙන් ගැටුම පිළිබඳ න්‍යායාත්මක දෘෂ්ටිය පදනම් කර ගනිමින් අලි - මිනිස් ගැටුම නූතන ගෝලීය සමාජයෙහි

ඉස්මතු වී පවතින්නේ කෙසේ ද යන්න සොයා බැලීම අත්‍යවශ්‍ය වේ. මෙම මූලික කාරණය පෙරදැරි කර ගනිමින් අධ්‍යයනයේ අරමුණු පහත පරිදි පෙළගැස්විය හැකි ය.

## අධ්‍යයනයේ අරමුණු

ගැටුම යන සංකල්පයට අදාළ ව පවතින න්‍යායික පර්යායන් මූලික කර ගනිමින් අලි - මිනිස් ගැටුම විශ්ලේෂණය අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ ලෙස දක්විය හැකි ය. එම ප්‍රධාන අරමුණ කේන්ද්‍ර කර ගනිමින් අධ්‍යයනයේ සුවිශේෂී අරමුණු පහත පරිදි වේ.

## සුවිශේෂී අරමුණු

අ. කුටුම්බ සුභසාධනය හා අලි - මිනිස් ගැටුම අතර පවතින අන්තර් සම්බන්ධතාව හඳුනා ගැනීම

ආ. අලි - මිනිස් ගැටුමෙහි පූර්වෝක්ති කාරණා හා එම ගැටුම වර්ධනය වීමට බලපා ඇති සාධක හඳුනා ගැනීම

ඇ. අලි - මිනිස් ගැටුම නිරාකරණය සඳහා වර්තමානයේ ගෙන ඇති පියවරවල ශක්‍යතාව හා දුබලතා හඳුනා ගැනීම අධ්‍යයනයේ සුවිශේෂී අරමුණු ලෙස දැක්විය හැකි ය.

## සාහිත්‍ය විමර්ශනය

අලි - මිනිස් ගැටුම පිළිබඳ නූතන ලෝකයේ අධ්‍යයන බහුල වශයෙන් සිදු කර ඇති බව සාහිත්‍ය විමර්ශන විශ්ලේෂණය කිරීමෙන් අනාවරණය කර ගත හැකි ය. එම අධ්‍යයන පාරිසරික විද්‍යාව, දේශපාලන දෘෂ්ටීන්, අර්ථ ශාස්ත්‍රය හා ශුද්ධ විද්‍යාත්මක අධ්‍යයනවලින් විග්‍රහ කර තිබේ. ශාස්ත්‍රීය ලිපි ලේඛන, පූර්ව අධ්‍යයන, පර්යේෂණ ලිපි හා ප්‍රකාශන බහුවිධ සාකල්‍යතාවකින් මෙම අධ්‍යයන සිදු කර ඇතත් එම අධ්‍යයන්හි ශාස්ත්‍රීය පර්යාවන්ගේ දිශාගත වීමක් දැකිය හැකි ය (Fernando, 2011). එහෙයින් ශාස්ත්‍රීය සාර සංයුක්ත ගවේෂණයන්ට අවශ්‍ය පසුබිම් සාධක නිර්මාණය කිරීමට මේ මගින් හැකියාව ලැබේ. ඒ හේතුවෙන් පර්යේෂණ සාහිත්‍ය වඩාත් ප්‍රශස්ත මට්ටමට පත් කිරීමටත්, ගැටුම්වාදී ව්‍යුහීය ආකෘතිය අර්ථකථනීය විශ්ලේෂණයකින් අනාවරණය කර ගැනීමටත් ඒ හා සමගාමී පර්යේෂණ සාහිත්‍යයක් බිහි වීමට අවශ්‍ය පසුබිම් සාධක ගොඩනැගීම මෙමගින් සිදු වේ (Perera, 2009; Yeo & Neo, 2010; Ekanayaka et al., 2011).

කුටුම්බ දරිද්‍රතාව හා අලි - මිනිස් ගැටුම අතර සෘජු සම්බන්ධතාවක් පවතින බව පෙර අධ්‍යයන සමාලෝචන මගින් අනාවරණය කළ හැකි ය. ආර්ථික හා සමාජ අන්තර් සම්බන්ධතා විහීනතාවට පත්වීමත් කුටුම්බ ආදායමෙන් ගැටුම සමථනය සඳහා මූල්‍ය වත්කම් වෙන් කිරීමට සිදුවීමත් නිසා කුටුම්බය සුභසාධනය බිඳ වැටී තිබේ. දරුවන්ගේ පාසල් අධ්‍යාපනය අඛණ්ඩ ව පවත්වා ගෙන යාම සඳහා කුටුම්බයෙහි මූල්‍ය වත්කම් හීන වීම අඩු

වයසින් පාසල් හැර යාම සඳහා හේතු වී ඇත. පාසල් අධ්‍යාපනය අතරමග නවතා දැමීමත් අඩු වයසින් ප්‍රජනන පවුල බිහි කර ගැනීමත් හේතුවෙන් කුටුම්බයෙහි සමාජ, ආර්ථික ගැටලු මතු වී ඇති බව අනාවරණය වේ. මෙම කාරණා හේතුවෙන් මානව ජන සමාජය විහීනතා උගුලකට (Deprivation trap) හසු වී ඇත (Bandara, 2002) .

දෛනික කාලය හා ආරක්ෂණ යාන්ත්‍රණය අලි - මිනිස් ගැටුමෙහි ප්‍රකට කෘත්‍ය ලෙස අනාවරණය කළ හැකි ය. කුටුම්බයෙහි මූලික අවශ්‍යතා ඉටු නොවීමත් බිඳුණු පවුල් පරිසරයක් බිහිවීමත් හේතුවෙන් දෛනික කාලය වක්‍ර ආර්ථික සංරචකයක් ලෙස ගැටුම තුළ ඉස්මතු වී ඇත. මේ හේතුවෙන් කුටුම්බයෙහි කායික හා චිත්තවේගීමය සහසම්බන්ධතා බිඳ වැටීමට ගැටුම හේතු වී ඇති බව අනාවරණය කරයි (Bandara, 2002; Santiapllai, 2010). ගැටුමේ පාදක කාරණා, ගැටුම් විසරණය පිළිබඳ පර්යේෂකයාගේ අවධානය යොමු නොකිරීම ඌනනයක් වේ. එහෙත් මෙම පර්යේෂණ පත්‍රිකාවේ කුටුම්බ සුභසාධනය වීම බිඳ වැටීම සඳහා ගැටුම පාදක වී ඇති ආකාරය අනාවරණය කිරීම පර්යේෂකයාගේ පර්යේෂණ සාහිත්‍ය සාරගර්භිතභාවය වර්ධනය කිරීමට හේතු වී ඇත.

ආර්ථික පිරිවැය, වර්තන වෙළඳපොළ ක්‍රියාකාරීත්වය හා ගැටුම අතර ත්‍රිකෝණාකාර සහසම්බන්ධිත ආකෘතිකමය සම්බන්ධතාවකින් යුක්ත ව ගැටුම විශ්ලේෂණය කර ඇත. වගා හානිය, පුද්ගලයෙක් මරණයට පත්වීම හා කෘෂිකාර්මික ඉඩම් කැබලි වීම පවතින වෙළඳපොළ මිල හා වාර්ෂික ආදායම අතර තුලනාත්මක සබඳතාවක් සමග ගණනය කොට එහි වෙළඳපොළ වටිනාකම නිශ්චය කිරීම සිදු කර ඇත. මූල්‍යමය වෙළඳපොළ හා කුටුම්භයෙහි ආදායම් උත්පාදකයාගේ මූල්‍යමය වත්කම අහිමි වීම සමස්ත කුටුම්බයේ පිරිවැය විශ්ලේෂණය මගින් අනාවරණය කරයි. මේ හේතුවෙන් ව්‍යසන කළමනාකරණයත් මූල්‍යමය පිරිවැය සම්බන්ධතාවත් ගැටුමෙහි නිලීන සාධකයෝ වෙති (Santiapllai et al., 2010). සන්තියාපිල්ලේ හා වෙනත් පර්යේෂකයන් විසින් (2010) ගැටුමෙහි මූල්‍යමය විශ්ලේෂණයක් සිදු කළත් එහි සමාජ පිරිවැය හා පාරිසරික පිරිවැය පිළිබඳ අවධානය යොමු නොකිරීම ඌනතාවක් වේ. එමෙන් ම ගැටුමෙහි මතුපිට සාධක පිළිබඳ සලකා බැලීමක් සිදු කළත් ගැටුමේ අභ්‍යන්තර සාධකවලට සම්පූර්ණයෙන් ම අවධානය යොමු නොකිරීම ගැටලු සහගත තත්ත්වයක් වේ. එහෙත් ගැටුම් පිළිබඳ විශ්ලේෂිත ආකෘතිකමය සංදර්භය න්‍යායික පර්යායක් මගින් විශ්ලේෂණය කිරීමේ දී පර්යේෂකයාට සාරගර්භිත ශාස්ත්‍රීය විශ්ලේෂණයකට අවශ්‍ය පසුබිම ගොඩනංවා ඇති බව අනාවරණය කළ හැකි ය.

සාම්ප්‍රදායික දේශීය ඥානය හා නූතන තාක්‍ෂණික ක්‍රම ශිල්ප තුලනාත්මක ව යොදා ගැනීමත් ගැටුම් ආකෘතිමය වෙනසියාව තුළ දී එම ක්‍රමශිල්ප උපයෝගී කරගැනීම සමථකරණ ක්‍රියාවලිය සඳහා ශක්‍යතාපූර්වක ආකලිතයක් වන බව දක්වයි. නූතන තාක්ෂණික ක්‍රමෝපාය අනුගමනය කිරීම ගැටුම් පරිසරයේ සංස්කෘතිය සමග ආකලිත නොවීම හේතුවෙන් නව

සංස්කෘතික පරිසරය සමග ආබද්ධ වීමට සත්ව ප්‍රජාවේ චර්යා රටාව වෙනස් නොවීම සෘජු වශයෙන් ගැටුම සමාජගත වීමට හේතු වී ඇති බව අනාවරණය කරයි. මේ හේතුවෙන් දේශීය වත්කම් සංචිත විදේශීය බහුජාතික සමාගම්වල ප්‍රාග්ධන සංචිත බවට පත්වී ඇති බව අධ්‍යයන දත්ත සනාථ කරයි (Fernando et al., 2011). ෆොනැන්ඩු සහ සෙසු පර්යේෂකයන්ගේ (Fernando et al., 2011) පර්යේෂණ පත්‍රිකාව තුළ ගැටුම් සඳහා සාම්ප්‍රදායික හා නූතන ක්‍රම අනුගමනය කළ යුතු බව අනාවරණය කළත් එම ක්‍රම අනුගමනය කළ යුතු ආකාරය පිළිබඳ නිශ්චිතව හඳුනා ගැනීමක් සිදු කර නොමැත. එමෙන් ම මැදිහත්කරණ ක්‍රමය රාජ්‍ය අංශය මගින් ලබා දිය යුතු යැයි සඳහන් වුවත් එය ගැටුම් නිරාකරණය සඳහා යොදා ගත යුතු ආකරය පිළිබඳ අධ්‍යයනයෙහි අනාවරණය කර නොමැත. ගැටුමෙහි මතුපිට සාධක පිළිබඳ පර්යේෂණ පත්‍රිකාවේ දී සාකච්ඡා කිරීම ඌනතාවක් වේ.

''ලාභය'' නමැති සාධකය වැවිලි ආර්ථිකයේ, ප්‍රධාන ආර්ථික සාධකය වූ අතර එය නව කෘෂිකාර්මික ආර්ථිකයක් සඳහා විපරිවර්තනය කිරීමට පූර්වෝක්ත සාධක සපයා ඇති බව අනාවරණය කරයි. සාම්ප්‍රදායික කෘෂි ඉඩම් වැවිලි ආර්ථිකයකට විපරිවර්තනය කිරීම, පෞද්ගලිකත්වය ආත්මීයකරණයට ලක්කිරිම හා මූල්‍ය ආර්ථිකය සමස්ත ක්‍රියාවලිය මෙහෙයවන අදෘශ්‍යමාන හස්තය බවට පත්වීම හේතුවෙන් පරිසර ප්‍රතිලාභ මානව කේන්ද්‍රීයකරණයට ලක්වීම ගැටුමේ තත්ත්වාකාර සාධක ලෙස අනාවරණය කරයි (ගුණසේකර, 2011; බණ්ඩාර, 2002). ආර්ථික බෝග වගාව සමග පාරිසරික වශයෙන් සිදු වන බලපෑම මානව ක්‍රියාකාරකම් හා අන්තර් සම්බන්ධතා පැවැත්වීම ගැටුමේ පූර්වෝක්ත සාධක වශයෙන් හඳුනා ගැනීමට පර්යේෂකයා පෙලඹී ඇත. සංවර්ධන ක්‍රියාදාම හා නව ලිබරල්වාදී ආකෘතිකමය සාධක ගැටුම් සමථනය විෂයෙහි යොදා ගත හැකි ආකාරය පර්යේෂණයෙන් අනාවරණය කර නොමැති වීමත් ගැටුමේ පූර්වෝක්ත සාධක සමථනය සඳහා යොදා ගැනීමේ දී මානව හා සත්ව ප්‍රජාවගේ අවශ්‍යතා සමග තුලනය නොවීම ගැටුම නිර්මාණය වීමේ ප්‍රමුඛ සාධකයක් බව අධ්‍යයනය මගින් අනාවරණය කර නොමැති වීම ඌනනයක් වේ.

පාරිසරික සාධක හා සත්ව චර්යා සංස්කෘතිය පරිසර පද්ධතිය සමග තීරණාත්මක සාධකයන් වන අතර එම සාධක ඔවුන්ගේ මූලික අවශ්‍යතා සමග කේන්ද්‍රගත වන ආකාරය ධර්මරත්න සහ මාගෙදරගමගේ (2014) පර්යේෂණ ලිපිය මගින් අනාවරණය කරයි. අලි ඇතුන් විසින් සිදු කරනු ලබන වගා හානි රටා පැහැදිලි කිරීමේ පහසුව තකා අලින්ගේ වාසභූමි තෝරා ගැනීම, එම වාසභූමි අතර උන්ගේ බෙදීයාම, ආහාර රටා හා සමාජ ව්‍යුහය ආදිය මෙම ආකෘතිය මගින් ඔවුන් අනාවරණය කර ඇත. වගාවන් හානි කරනු ලබන අලින්ගේ චර්යා අවබෝධ කර ගැනීම, අලි - මිනිස් ගැටුම් පිළිබඳ විසඳුම් සොයා යාමේ දී ඉමහත් උපකාරයක්

වන බවත් එය ගැටුම් සමථකරණයට සෘජු ව අදාළ කර ගත හැකි බව මෙම පර්යේෂණ ලිපිය පරීක්ෂා කිරීමේ දී අනාවරණය වේ.

තිරසාර පාරිසරික සංවර්ධනය හා මානව කේන්ද්‍රීයකරණය යන කාරණා අලි-මිනිස් ගැටුමෙහි තුලනාත්මක සාධක ලෙස හඳුනාගෙන ඇත. සංවර්ධන ප්‍රතිපත්තිවල තිරසාරත්වය පිළිබඳ සංකල්පයෙන් බැහැර ව සංකීර්ණ මානව අවශ්‍යතා පරිසර ප්‍රතිලාභ සමග තුලනය කිරීමත් සම්පත් අවභාවිතයත් හේතුවෙන් මෙය දිග්ගැස්සුණු සමාජ ගැටුමක් බවට පත් ව තිබේ. ස්වාභාවික සම්පත් අධි පරිභෝජනය, කෘෂිකාර්මික පරිසර පද්ධතියක් බිහි වීම, සත්ව ප්‍රජාව අතික්‍රමණය කරමින් මෙගා සංවර්ධන ව්‍යාපෘති ග්‍රාමීය තලයෙහි ක්‍රියාත්මක වීම හා නිජබිම් සංවර්ධන ව්‍යාපෘති සඳහා අවභාවිතය හේතුවෙන් සම්පත් අත්පත් කර ගැනීමට නොහැකි වීම ගැටුමේ ප්‍රකට හා නිලීන සාධක බව අනාවරණය කරයි. ජලාශ්‍රිත ශිෂ්ටාචාර බිඳ වැටීමත් සමග මිනිසුන් තෙත් කලාපයට සංක්‍රමණය වීමත් වියළි කලාපය ආශ්‍රිත ව ද්විතියික වනාන්තර වර්ධනය වීම අලීන්ගේ වාසභූමි අහිමි කිරීමට හේතු වී ඇත. මේ හේතුවෙන් තිරසර ක්‍රමෝපායන් සමථන ක්‍රියාවලියක් මගින් ඉටු කිරීමට වඩා තාවකාලික විසඳුම් ක්‍රියාවලින් කෙරෙහි අවධානය යොමු කිරීමට පුද්ගලටා පෙලඹී ඇති බව අනාවරණය කර යි (ගුණවර්ධන, 2018; ද සිල්වා, 2010; Santiapillai, 1996). ගුණවර්ධන(2018), ද සිල්වා(2010) හා Santiapillai (1996) පර්යේෂකයින්ගේ අධ්‍යයනවල හරිත සංවර්ධන ක්‍රමෝපායන් අහිමි වීම ගැටුම සඳහා හේතු වී ඇති බව සාකච්ඡා කළ ද එම සංවර්ධන ක්‍රමෝපාය පාරිසරික සාධක හා මෙගා සංවර්ධන ව්‍යාපෘති සමග සම්බන්ධ වන ආකාරය පිළිබඳ ව අනාවරණය කර නොමැත. සංවර්ධන ව්‍යාපෘතිකරණය මානවයාගේ සංකීර්ණ අවශ්‍යතා සහ භෞතික සංවර්ධන ප්‍රතිලාභ කෙරෙහි සෘජු අවධානයක් යොමු කළ ද සත්ව ප්‍රජාවගේ මූලික අවශ්‍යතා සංවර්ධන ව්‍යාපෘතිකරණයත් සමග සාකච්ඡා නොකිරිම ඌනතාවක් වේ.

සාහිත්‍ය විමර්ශනයට අදාළ පර්යේෂණ සාහිත්‍ය පරීක්ෂා කිරීමේ දී අනාවරණය වන්නේ නූතන ගෝලීයකරණය, සංවර්ධන ව්‍යාපෘතිකරණය හා නවීන කෘෂිකාර්මික ක්‍රමෝපායන් අනුගමනය කිරිම ගැටුමේ පාදක සාධක වී ඇති බව යි. එහෙත් ගෝලීයකරණ ක්‍රියාවලිය, සංවර්ධන ක්‍රමෝපායන්, පාරිසරික විසංතුලනය සත්ව හා මානව ප්‍රජාවගේ ජන ජීවිතය සඳහා බලපා ඇති ආකාරය පර්යේෂණ තේමාව මගින් අනාවරණය කර ගැනීම පර්යේෂකයාගේ පර්යේෂණයේ වැදගත්කම හා අවශ්‍යතාව ඉස්මතු කර යි.

## අධ්‍යයන ක්‍රමවේදය

මෙම පර්යේෂණය ප්‍රමාණාත්මක විශ්ලේෂණය කේන්ද්‍ර කර ගනිමින් මිශ්‍ර ක්‍රමවේදය (Mixed Method) උපයෝගී කර ගත් අතර එම ක්‍රමවේදය භාවිත කරමින් දත්ත එක්රැස් කිරිම සිදු කරන ලදි. ඒ අනුව ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත විග්‍රහයක් මගින් අධ්‍යයන ගැටලුව

විශ්ලේෂණය කිරීමට වඩාත් යෝග්‍ය සමීක්ෂණ ක්‍රමවේදය (Babbie, 2004) වූ හෙයින් පර්යේෂකයාගේ අවධානය ඒ සඳහා යොමු විය. වයස් ව්‍යූහය, පුමතිරිභාවය, අධ්‍යාපන මට්ටම හා අලි - මිනිස් ගැටුම වැළැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග හා අලි - මිනිස් ගැටුමේ වින්දිතභාවය අධ්‍යයන ප්‍රදේශයෙහි විසරණය වී ඇති ආකාරය පිළිබඳ අනාවරණය කර ගැනීමට සමීක්ෂණ ක්‍රමවේදය වඩාත් යෝග්‍ය විය. මේ හේතුවෙන් විචල්‍යය අතර සංඛ්‍යාන දත්ත හා ගුණාත්මක දත්ත අන්තර් සම්බන්ධතා හා අන්තර් පරායත්තතාවන් දක්වන ආකාරය අනාවරණය කර ගැනීමට හැකියාව ලැබුණි. විශේෂයෙන් ම ප්‍රමාණාත්මක දත්ත මගින් සාධනීය ලෙස විශ්ලේෂණය කිරීමට නොහැකි වූ දත්ත (Maxwell, 1996) වඩාත් ප්‍රායෝගික ව හා වින්දිතයන්ගේ ගැටලු, ආකල්ප වඩාත් යෝග්‍ය පරිදි ඉදිරිපත් කිරීමට ගුණාත්මක දත්ත පාදක විය. උදාහරණයක් ලෙස කුටුම්බයෙහි ආදායම අහිමි වීමේ ශීඝ්‍රතාව සංඛ්‍යාන දත්ත මගින් ඉදිරිපත් කිරීමට හැකියාව ලැබුණත් ආදායම් අහිමි වීම කුටුම්බයේ කවර අංශය සඳහා බලපා තිබේ ද යන්න අනාවරණය කර ගැනීමට ගුණාත්මක දත්ත යටතේ අධ්‍යයනය සඳහා තෝරාගත් ක්‍රම ඉවහල් විය. මේ හේතුවෙන් සංඛ්‍යානමය වශයෙන් ලැබුණ දත්ත පුරෝකථනමය විසරණයක සිට ගැඹුරු විශ්ලේෂණවලට අධ්‍යයනය විපරිවර්තනය කිරීමට හැකියාව ලැබුණි.

අලි - මිනිස් ගැටුම අධ්‍යයන ප්‍රදේශයෙහි පොදු ගැටලුවක් වුවත් එම ගැටලුව ප්‍රජාවේ පුද්ගලයන්ට විවිධතා ඇති කරන ලදි. මේ හේතුවෙන් ප්‍රජාවේ එක් එක් පුද්ගලයන්ට එහි බලපෑම වඩාත් නිශේධනීය ලෙස බලපා ඇති ආකාරය අනාවරණය කර ගැනීමට ප්‍රත්‍යේක අධ්‍යයන ක්‍රමය වඩාත් යෝග්‍ය විය. මේ අනුව අධ්‍යයන ප්‍රදේශ ද්විත්වය ම කේන්ද්‍ර කර ගනිමින් ප්‍රත්‍යේක අධ්‍යයන 02ක් උපයෝගී කර ගැනුණි. අධ්‍යයනය සඳහා කේන්ද්‍රගත සම්මුඛ සාකච්ඡා 03ක් උපයෝගී කරගත් අතර එහි දී වයස් ව්‍යූහයන්, රැකියාවන්ගේ ස්වභාවය, අලි - මිනිස් ගැටුම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග හා ඒවා අසාර්ථක වීමට හේතු වූ කාරණා පිළිබඳ අවධානය යොමු කිරීම නිසා සමස්ත ප්‍රජාවට එහි ඇති බලපෑම ගැඹුරින් අනාවරණය කර ගැනීමට හැකියාව ලැබුණි. විශේෂයෙන් ම කේන්ද්‍රගත සම්මුඛ සාකච්ඡා හා ප්‍රත්‍යේක අධ්‍යයන කෙරෙහි පර්යේෂකයාගේ අවධානය යොමු වූයේ සංඛ්‍යාන දත්ත මගින් අනාවරණය කරගත් තොරතුරු තවදුරටත් ගුණාත්මක දත්ත මගින් තහවුරු කිරීමටත් සංඛ්‍යානමය දත්ත මගින් අනාවරණය නො වූ තොරතුරු අධ්‍යයන ගැටලුව සාධනය කිරීමට දක්වන විභවතාව විශ්ලේෂණය කිරීම සඳහා ය. මේ හේතුවෙන් ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත බහුවිධ ව ගැටලුව ගොඩනැංවීමට සිදු කරන කාර්යයන් අනාවරණය කර ගත හැකි විය. අධ්‍යයනයේ දේපොළ හා ජීවිත හානි, පුමතිරිභාවය, ආදායම් මට්ටම හා ණය ලබා ගැනීම සඳහා හේතු වූ කාරණා ආදි මූලික තොරතුරු තනි විචල්‍යයන් ලෙස විසරණය වී ඇති ආකාරය අනාවරණය කර ගත හැකි විය. ප්‍රශ්න මාලාව මගින් ලබාගත් දත්ත මත පදනම් ව මෙම විසරණය සනාථ විය. කුටුම්බයේ ආදායම් මට්ටම ස්වායත්ත විචල්‍ය ලෙස

භාවිත කරමින් කුටුම්බ සාමාජිකයන් සංඛ්‍යාව, රැකියාවේ ස්වභාවය සමස්ත ගැටුම තුළ අනාවරණ දත්ත මගින් හෙළි කර ගත හැකි විය. මේ හේතුවෙන් ස්වායත්ත විචල්‍යයේ බලපෑම පරායත්ත විචල්‍යය විසරණය වීම සඳහා කවර හේතු සාධක බලපෑමක් සිදු කරන්නේ ද යන්න අනාවරණය කර ගැනීමට අවකාශ ලැබුණි. සමස්ත ස්තර අතර ගැටුමේ සමාජ, ආර්ථික හා සංස්කෘතික බලපෑම විසරණය වී ඇති ආකාරය අනාවරණය විය.

ප්‍රාථමික දත්තවලට අමතර ව ද්විතීයික දත්ත මෙම පර්යේෂණ ගැටලුව විශ්ලේෂණය කිරීමේ දී අත්‍යවශ්‍ය වේ. ඒ අනුව උක්ත පර්යේෂණයට අදාළ ව ලිය වී ඇති පර්යේෂණ වාර්තා, පොත්පත්, පුවත්පත්, වාර සඟරා, අන්තර්ජාලය, ශ්‍රී ලංකාවේ බහුපාර්වීය පාරිසරික ගිවිසුම් පිළිබඳ අත්පොත හා වනජීවී දෙපාර්තමේන්තුවේ මේ සම්බන්ධ ව ලියවී ඇති ශාස්ත්‍රීය මූලාශ්‍රය පරිශීලනය කරන ලදි.

## අධ්‍යයන නියැදිය

අධ්‍යයන නියැදිය ලෙස සසම්භාවී නියැදිය යටතේ ස්තෘත (Stratified Sampaling) නියැදිය තෝරා ගන්නා ලදි. එමෙන් ම අධ්‍යයන නියැදියේ දී සහජාතීයත්වය ආරක්‍ෂා කර ගැනීම හා විචල්‍යයන්ගේ හැසිරීමේ ස්වභාවයේ පවතින ගතික බව සඳහා වයස් ව්‍යුහය, අධ්‍යාපන මට්ටම, සේවා නියුක්තියේ ස්වභාවය හා පුමතිරිභාවය කෙරෙහි අවධානය යොමු කිරීම සිදු විය. අධ්‍යයන ප්‍රදේශය ග්‍රාමීය අංශය නියෝජනය කිරීම හේතුවෙන් එම ප්‍රජා කණ්ඩායම් භූගෝලීය වශයෙන් පදිංචි වී ඇති ආකාරය, නිවාස රටාවේ හා රැකියාවේ ස්වභාවය යන ස්ථරීකරණ සාධකය සැලකිල්ලට ගත් අතර එම සංකේන්ද්‍රණය වීම මගින් ග්‍රාමීය ඒකකයේ පන්ති පදනම් ව්‍යාප්තික රටාව පිළිබඳ ව ද නියැදියෙහි අන්තර්ගත කරන ලදි. මෙහි දී ස්තර ජනගහන නියැදියට අදාළ ව ග්‍රාම නිලධාරී කොට්ඨාස ද්විත්වය තුළින් ම සමානුපාතික ස්තර නියැදියට යටත් ව නියැදිය තෝරා ගැනීම සිදු විය. තණමල්විල ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රකාශයට පත් කරන ලද තෝරා ගත් අධ්‍යයන ක්ෂේත්‍රයන්හි ග්‍රාම නිලධාරී වාර්තා පරිශීලනය කරමින් ග්‍රාම නිලධාරී කොට්ඨාස දෙක සඳහා 5%ක නියැදියක් අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදි. එය පහත පරිදි වගු සටහනක් ආශ්‍රයෙන් පැහැදිලි කළ හැකි ය.

වගු අංක 01: *නියැදි ජනගහනය*

| ග්‍රාමනිලධාරී කොට්ඨාසය | මුළු ජනගහනය | නියැදිය |
|---|---|---|
| හම්බෙගමුව | 3878 | 194 |
| හම්බෙගමුව ජනපද | 2562 | 128 |
| මුළු එකතුව | 5724 | 322 |

මූලාශ්‍රයඃ-ක්ෂේත්‍ර අධ්‍යයනය, 2020/2021

## දත්ත විශ්ලේෂණය

ප්‍රශ්න මාලාවෙන් ලැබුණු දත්ත සංඛ්‍යාන විද්‍යාව උපයෝගී කරගනිමින් වගු හා ප්‍රස්තාර සටහන් මගින් ඉදිරිපත් කරන ලදි. සංඛ්‍යාන දත්ත මගින් සනාථ කරගත් තොරතුරු ගුණාත්මක දත්ත මගින් විශ්ලේෂණය කිරීමට අවශ්‍ය වීම හේතුවෙන් දත්තවල විචලනය වීම හා තොරතුරුවල වලංගුභාවය තහවුරු කිරීමට දත්ත අතර සැසඳීමක් සිදු කරන ලදි. එමගින් අධ්‍යයනයේ අනාවරිත දත්තවලට වාස්තවික පදනමක් ලබා දෙන ලදි. ඒ අනුව ගුණාත්මක දත්ත තේමා විශ්ලේෂණය මගින් බහුවිධ ප්‍රශ්න අතර අන්‍යෝන්‍ය සහසම්බන්ධතාව අනාවරණය කරන ලදි. එමෙන් ම සංසිද්ධීන් දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අතර දෘඩ සහසම්බන්ධතාවක් පවතින්නේ නම් ඒ අතුරින් එක් සංසිද්ධියක් අනෙකුත් ඒවා ඇති කරලීමට හේතුකාරක වන බව පිළිගනු ලැබිණි. තවද සංසිද්ධීන් ගණනාවක් එකට පවත්නා සේ පෙනී ගිය ද එකිනෙක අතර සම්බන්ධතාවක් නැති බව ද පෙනී ගිය අවස්ථා පවතී. එක් සංසිද්ධියක් අනෙක් සංසිද්ධිය නිර්මාණය කිරීමේ හේතුව නොවන බව ඇතැම් අවස්ථාවන්හි දී ප්‍රත්‍යක්ෂ විය. එවැනි අවස්ථාවන්හි දී තුන්වන සාධකයක් අදාළ සංසිද්ධීන් දෙක ම බිහි කරලීමේ හේතුකාරකය වී ඇති බව පෙනී ගිය අවස්ථා ද පවතී.

## පර්යේෂණයට අදාළ හර සංකල්ප විග්‍රහ කිරීම

## ගැටුම අර්ථකථනය කිරීම

අලි - මිනිස් ගැටුම නූතන සමාජයේ ප්‍රකට ගැටුමක් බවට පත්වී ඇති අතර ගැටුම්වාදී න්‍යායන් කේන්ද්‍ර කර ගනිමින් එය විශ්ලේෂණය කිරීමට පර්යේෂකයන් යොමු වීමේ ඌනනයක් හඳුනා ගත හැකි ය. එහෙයින් මෙහි දී ගැටුම්වාදී න්‍යායික පර්යාය සඳහා අනුපූරක සම්බන්ධතා පවතින ගැටුම පිළිබඳ නිර්වචනීය අර්ථ දැක්වීම සමුච්චිත කර ගනිමින් පර්යේෂණයේ හර සංකල්ප විග්‍රහ කිරීම සිදු වේ. ඒ අනුව පර්යේෂණයේ දී ගැටුම යන අර්ථකථනීය විග්‍රහයන්ගේ දෘෂ්ටිකෝණ අනාවරණය කර ගැනීම සිදු වේ. ගැටුමක් යනුවෙන් සරල ව අර්ථ දක්වන්නේ නම් එය ප්‍රචණ්ඩකාරී සට්ටනයක් වේ. මෙය කණ්ඩායම් දෙකක්, රටවල් දෙකක් හෝ කිහිපයක් අතර සිදු විය හැකි අන්‍යෝන්‍ය අවශ්‍යතා සපුරා ගැනීම උදෙසා උද්ගත වන ප්‍රචණ්ඩකාරීත්වයක් වේ. එහෙයින් ගැටුමෙහි භෞතික හා මානසික (විඥානමය) සංසිද්ධීන් අන්තර්ගත වේ. සමාජ ගැටලු පිළිබඳ ගැටුම් න්‍යායාචාර්යවරුන් විවිධ අයුරින් නිර්වචනය කර ඇත. ඒ අනුව ජොහාන් ගැල්ටුන් ගැටුම පිළිබඳ පහත පරිදි අර්ථ දක්වනු ලබයි (කරුණාදාස, 2003).

ගැටුම යනු අනන්‍ය කර ගත හැකි මානව කණ්ඩායම් සවිඥානික ප්‍රතිපක්ෂ බවට පත් ව තම තමාට පොදුවේ අත්පත් කරගත නොහැකි දේ අත්පත් කර ගැනීමට යාමේ දී ඇති වන තත්ත්වය යි (Galtung, 1975). ගැල්ටුන්ගේ (1975) මෙම නිර්වචනයෙහි මූලික කාරණා කිහිපයක් අන්තර්ගත කර ඇත. එනම් සවිඥානික ප්‍රතිපක්ෂ යනුවෙන් අදහස් කරනු ලබන්නේ දෙපාර්ශ්වයේ ම දැනුවත්භාවය මත කණ්ඩායම් දෙකකට බෙදීම යන්න යි. එනම් තම

පාර්ශ්වයට අදාළ අනන්‍යතාවක් පවතින අතර ප්‍රතිපාර්ශ්වයට ද අනන්‍යතාවක් පවතිනවා යන්න යි. එය දෙපාර්ශ්වය ම මනාව හඳුනා ගෙන ඇති අතර එම අනන්‍යතාවට අදාළ කණ්ඩායම් ද අනෙක් කණ්ඩායමෙන් වෙන් කර හඳුනා ගත හැකි බව මෙහි ලා අර්ථ දැක්වේ. පොදුවේ අත්පත් කර ගත නොහැකි යන්නෙන් අදහස් කරනු ලබන්නේ දෙපාර්ශ්වයට ම එකවර අයිති කර ගත නොහැකි යම් යම් කාරණා ය. එනම් විකල්ප රහිත එක් අරමුණක් ළඟා කර ගැනීම උදෙසා දෙපාර්ශ්වයක් උත්සාහ කිරීම පිළිබඳ මෙයින් අදහස් කෙරේ.

කෝසර් (1986) ගැටුම මූලික වර්ග තුනකට බෙදා අධ්‍යයනය කළ හැකි බව දක්වයි. එනම්,

1. පුද්ගල අභ්‍යන්තර ගැටුම්

2. අන්තර් පුද්ගල ගැටුම්

3. සමාජ ගැටුම

කෝසර් (1986) සමාජ ගැටුම් යන්න  පිළිබඳ වැඩි අවධානයක් යොමු කර ඇති අතර ගැටුම පහත පරිදි අර්ථකථනය කරයි. ''ප්‍රතිවාදීන්ගේ අරමුණු අකර්මණ්‍ය කරලීමට ඔවුන්ට හානි පැමිණවීමට නැතහොත් විනාශ කරලීමට උත්සාහ කරමින් හිඟ තත්ත්ව වන බලය හා සම්පත් පිළිබඳ ව පවතින ඉල්ලීම් හා ආශාව තුළ මතු වන අරගලය යි'' (කෝසර් උපුටා ගනු ලැබුවේ Pruitt and Rubin, 1986). කෝසර් මෙහි දී ගැටුම තුළ අන්තර්ගත ප්‍රධාන කාරණා කිහිපයක් පිළිබඳ අර්ථ දැක්වීම සිදු කරයි. එනම් සීමිත තත්ත්වයක් වන බලය හා සම්පත් ළඟා කර ගැනීම උදෙසා ප්‍රතිපාර්ශ්ව කෙරෙහි ප්‍රචණ්ඩත්වය මුදාහැරීම ගැටුමක් ලෙස අර්ථ දක්වා ඇත. මෙම නිර්වචනයේ සුවිශේෂීත්වය වන්නේ මෙය ක්ෂුද්‍ර මට්ටමේ ගැටුමක් හෝ සැඟවුණු ගැටුමක් වැනි සුවිශේෂී අවස්ථා හැඳින්වීමට භාවිත කළ නොහැකි වීම යි. එහෙත් අන්තර් රාජ්‍ය ගැටුම් හා ත්‍රස්තවාදී ගැටුම් විශ්ලේෂණය කිරීමේ දී මෙම නිර්වචනය වඩාත් ප්‍රශස්ත වේ.

ෂෙලන්බර්ග් (1962)ගැටුම සම්බන්ධයෙන් ඉදිපත් කරන නිර්වචනය ද ඉතා වැදගත් වේ. තරගකාරී අභිලාෂ, විවිධ වූ අනන්‍යතාවන් හා ආකල්පීය වෙනස්කම් මත පුද්ගලයන් හෝ කණ්ඩායම් අතර ඇති වන ප්‍රතිවිරෝධීතාව ගැටුමක් වේ.

මෙම නිර්වචනයේ දී ගැටුමෙහි පවතින මූලික කාරණා තුනක් පිළිබඳ විශ්ලේෂණය කරයි. එනම්

1. තරගකාරී අභිලාෂ

එනම් එක් අරමුණක් වෙනුවෙන් තරගකාරීත්වයක් ඇති වීම මගින් ගැටුම නිර්මාණය වේ.

2. විවිධ වූ අනන්‍යතාවන් පුද්ගලයාගේ වටිනාකම්, ඇදහිලි හා විශ්වාස ආදිය මෙයට අයත් වේ. ජාතිකත්වය, ආගම, වර්ණය හා කුලය වැනි සාධක මෙයට අයත් වේ.

3. ආකල්පීය වෙනස්කම්

පුද්ගලයෙක් සිතන පතන ආකාරය ආකල්පයක් වේ. මෙය එක් පුද්ගලයෙක්ගෙන් තවත් පුද්ගලයෙක්ට වෙනස්විය හැකි ය. පුද්ගලයා හැසිරෙන්නේ තම ආකල්පවලට අනුව බැවින් ආකල්පමය තත්ත්ව පුද්ගල චර්යාවෙන් පිළිබිඹු වේ. ඒ අනුව පුද්ගලයන් දෙදෙනෙකුගේ චර්යාව එකිනෙකට වෙනස් වේ. යම් හෙයකින් එක් අයෙකුගේ චර්යාව තවත් කෙනෙකුට නුරුස්සන්නේ නම් එහි දී ආකල්පමය වෙනස්කම් මත ගැටුම නිර්මාණය වේ (ෂෙලන්බර්ග් උපුටා ගනු ලැබුවේ Boulding, 1962).

පුද්ගලයාගේ චර්යාව, අවශ්‍යතා හා ආකල්ප ගැටුම නිර්මාණය වීමේ ප්‍රධානතම සාධක වී ඇති බව අර්ථකථනීය විශ්ලේෂණයන් මගින් අනාවරණය වේ. පර්යේෂණයේ කේන්ද්‍රීය හා පරිධිය සාධක මෙම ගැටුම් විශ්ලේෂණයෙහි අඩංගු කාරණා සමග අන්තර් සම්බන්ධතා මෙන් ම අන්තර් පරායත්තතාවයක් දැකිය හැකි අතර එය අධ්‍යයන ප්‍රදේශය තුළ ගැටුම්වාදී ව්‍යුහීය ආකෘතිය අනාවරණය කරගැනීම සඳහා සාධනීය පසුබිමක් නිර්මාණය කර ඇත. එහෙයින් ගැටුමේ නිර්වචනීය අර්ථ දැක්වීම හා එය තෝරා ගත් න්‍යායාත්මක රාමුව සංවර්ධනය කිරීමත් ගැටුමේ ව්‍යවහාරික ආකෘතිය හඳුනා ගැනීමටත් මග පෙන්වීමක් සිදු කරනු ලබයි.

## පර්යේෂණයෙහි න්‍යායික රාමුව විග්‍රහ කිරීම

මෙම පර්යේෂණයේ න්‍යායික රාමුව ලෙස භාවිත වනුයේ දිග්ගැස්සුණු සමාජ ගැටුම යි. ගැටුම් න්‍යායික පර්යාවන් බහුවිධ ස්වභාවයක් පවතින අතර අලි - මිනිස් ගැටුම වඩාත් ප්‍රවේශවාදී ආකෘතියකින් විග්‍රහ කිරීමට වඩාත් යෝග්‍ය න්‍යාය දිග්ගැස්සුණු සමාජ ගැටුම යි. විශේෂයෙන් ම ගැටුම විටෙක උත්සන්න වෙමින් තවත් විටෙක සැඟවුණු ගැටුමක් ලෙස දිග්ගැස්සුණු සමාජ ගැටුම ක්‍රියාත්මක වේ. එමෙන් ම නව දුක්ගැනවිලි එකතු වෙමින් ගැටුමට පාදක වු හේතු නොකඩවා ඒකරාශී වීමක් දැකිය හැකි වේ. විශේෂයෙන් ම ප්‍රචණ්ඩකාරී අවස්ථා වඩාත් උත්සන්න වු විට අතිශය දරුණු ගැටුමක් දක්වා සමාජගත වීමක් දැකිය හැකි වේ. මේ හේතුවෙන් ගැටුම් පාර්ශ්ව අතර නොසංසිඳියාවක් ඇති කිරීම දක්වා ගැටුම ගැඹුරට ම විහිදීමක් සිදු වේ (විතාරණ සහ චන්ද්‍රසේකර, 2012).

මූලික අවශ්‍යතා නොලැබී යාම ගැටුම් පාර්ශ්ව මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වන අතර පැවැත්ම තීරණය වීම සඳහා හේතු සාධක වන කාරණා කිහිපයක් ද මෙම ගැටුම් න්‍යායෙහි අන්තර්ගත වේ.

1. පිළිගැනීම සම්බන්ධ අවශ්‍යතා

2. ආරක්‍ෂණ අවශ්‍යතා

3. දේශපාලන සංස්ථා, වෙළඳපොළ හා අනෙකුත් තීරණ ගැනීමේ ආයතනයන්හි තීරණ ගැනීමේ ක්‍රියාවලියට මැදිහත්වීමට ඇති අවශ්‍යතාව (Azar, 1990).

මේ හේතුවෙන් ගැටුම් න්‍යායික පර්යාලෝක පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී පර්යේෂණ ගැටලුව සඳහා විභවතාව සපයනු ලබන්නේ දිග්ගැස්සුණු සමාජ ගැටුම යි. දිග්ගැස්සුණු සමාජ ගැටුම සමාජයේ ප්‍රකට හා නිලීන ලක්ෂණ ඉස්මතු කරමින් සමාජ ව්‍යුහයෙහි විවිධ ස්ථර මතු කිරීමත් එය ගැටුම් පාර්ශ්වයේ බහුවිධ දුක්ගැනවිලි අනාවරණය කිරීමට අවශ්‍ය පසුබිම් සාධක නිර්මාණය කිරීමත් හේතුවෙන් ගැටුමේ බහුවිධ සාධක මෙම න්‍යාය මගින් අනාවරණය කළ හැකි ය. විශේෂයෙන් ම නූතන රාජ්‍යයන්ගේ ජාතිකවාදය හා නූතනත්ව සාධකය දිග්ගැස්සුණු සමාජ ගැටුමෙහි අන්තර්ගත වීමත් පර්යේෂණය සඳහා මෙහි ඇති අදාළත්වය පිළිබඳ විමසා බැලීමේ දී **"රාජ්‍ය"** යන සංකල්පයෙන් නොව ගැටෙන පාර්ශ්වවල **"අනන්‍යතා"** හා **"අවශ්‍යතා"** සාධක අතර තුලනාත්මක සම්බන්ධතාව මෙම ගැටුම් න්‍යාය මගින් සනාථ කිරීම සඳහා අවශ්‍ය පසුබිම් සාධක ගොඩනැගී ඇති බව සනාථ කළ හැකි ය. එය ප්‍රකට අර්ථයෙන් නොව විශ්ලේෂිත කරුණු සාධනීය ගැඹුරු විශ්ලේෂණයක් මගින් සාධකගත කිරීමට හැකි වීම සෛද්ධාන්තික පසුබිම සනාථ කරන සාධකයෝ වෙති. විශේෂයෙන් ම අලි - මිනිස් ගැටුම පර්යේෂකයා උපයෝගී කර ගත් ගැටුම් න්‍යායේ විවිධ ස්ථරවල සමාජගත වී සමාජ ව්‍යුහය වෙනසියාවකට ලක්කිරීමට හේතු වී ඇත. ඒ අනුව මානව ගැටුම් විශ්ලේෂණය කිරීමේ ප්‍රධාන න්‍යායික පසුබිමක් මෙම ගැටුම් න්‍යායේ අන්තර්ගත වුවත් සත්ව හා මානව ගැටුම විශ්ලේෂණය කිරීමට ශක්‍යතාවක් මෙහි පැවතීම හේතුවෙන් පර්යේෂණය සඳහා දිග්ගැස්සුණු සමාජ ගැටුම සෛද්ධාන්තික රාමුව ලෙස උපයෝගි කර ගන්නා ලදි.

## අධ්‍යයන ප්‍රදේශය - මොනරාගල දිස්ත්‍රික්කයේ හම්බෙගමුව හා හම්බෙගමුව ජනපදය

මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික දත්ත රැස්කිරීමට යොදා ගනු ලැබූ අධ්‍යයන ප්‍රදේශය මොනරාගල දිස්ත්‍රික්කයේ තණමල්විල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරි වසම් දෙකකි. එනම් 149 හම්බෙගමුව හා 149 - 1 හම්බෙගමුව ජනපදය යි. තණමල්විල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය වර්ග කිලෝමීටර් 666.5 පමණ විශාල වූ තැනිතලා භූමියකින් යුක්ත ප්‍රදේශයක් වේ. මෙම ප්‍රදේශය අතීතයේ දී කොරන්ගල බිම්තැන්න, කෝරලය හා සින්තරම් පළාත් කෝරලය නමින් බල ප්‍රදේශ දෙකකට වෙන් ව තිබූ බව සඳහන් වේ. ප්‍රදේශයේ තැනිතලා ස්වභාවය හේතුවෙන් ''බිම්තැන්න'' යන නාමය ලැබී ඇති බව ජනශ්‍රැති මගින් අනාවරණය වේ. තණමල්විල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිරින් හම්බන්තොට දිස්ත්‍රික්කයට මායිම් වන අතර දකුණින් සෙවනගල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට මායිම් ව ඇත. එමෙන් ම උතුරින් වැල්ලවාය ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට ද බටහිරින් රත්නපුර දිස්ත්‍රික්කයට ද ඊසාන දිගින් බදුල්ල දිස්ත්‍රික්කයට ද මායිම් ව පිහිටා තිබේ (තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, 2019). තණමල්විල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් 14ක් වන අතර භූගෝලීය, සමාජීය හා ආර්ථික වශයෙන් ගතිකත්වයන් නිර්මාණය වී ඇති බව අනාවරණය කළ හැකි ය. එහෙයින් එම

සාධක අධ්‍යයන ප්‍රදේශයේ සුවිශේෂීත්වයට මෙන් ම අදාළ පර්යේෂණ ගැටලුව වඩාත් සාධාරණීකරණයට ලක් කිරීමට හේතු විය.

**හම්බෙගමුව**

තණමල්විල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හම්බෙගමුව ග්‍රාම නිලධාරී වසම අනෙකුත් ග්‍රාම නිලධාරී වසම් සමග සන්සන්දනය කිරීමේ දී විශාලත්වයෙන් ඉහළ ම ග්‍රාම නිලධාරී වසම වේ. වර්ග කිලෝමීටර් 107.52 වන අතර මුළු ජනගහනය 3162ක් වේ (තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, 2019). ආගම් විවිධත්වය අනුව බහුවිධ ස්වරූපයක් හම්බෙගමුව ග්‍රාම නිලධාරී වසමෙහි හඳුනාගත හැකි වන අතර ජාතීන් අනුව සමස්ත ජනගහනය සිංහල ජනවර්ගය වේ. පර්යේෂකයා විසින් මෙම සමාජ ගතිකත්වය පිළිබඳ මූලික අවධානය යොමු කරනු ලැබුවත් ප්‍රතිචාරකයන් ගම සම්බන්ධයෙන් අනාවරණය කරන ලද ජනශ්‍රැති කෙරෙහි ද අවධානය යොමු කරන ලදි. එහෙයින් අධ්‍යයනය සඳහා සහවේදන ක්‍රමය උපයෝගී කර ගැනීමට පර්යේෂකයා සෑම විටම උත්සාහ කළේ ය. ඒ අනුව ප්‍රජාවන් පාරම්පරික කෘෂිකර්මාන්තය මත ජීවනෝපාය සකස් කර ගැනීමත් හේන් ගොවිතැන මූලික ජීවනෝපාය බවට පත් වීමත් අභිචාර විධි ගම්මානයේ වගාවන් සඳහා වර්තමානයේ භාවිත වීමත් අධ්‍යයන ප්‍රදේශයේ ජනශ්‍රැතියෙහි පවතින සුවිශේෂීතාව වේ. එහෙයින් වන සතුන් වඩාත් ආකර්ෂණයක් පවතින හේන් වගාවන් හේතුවෙන් ගැටුම් වඩාත් සුලභ වී ඇති බව අනාවරණය විය. පර්යේෂකයා හම්බෙගමුව ගම්මානයෙහි අධ්‍යයන කටයුතු සඳහා මෙම සුවිශේෂී ක්‍රම ද්විත්වය සම්මිශ්‍ර ව සහජාතික සම්බන්ධතාවක් මත අධ්‍යයනය සිදු කිරීම ද සුවිශේෂී කරුණක් වේ.

**හම්බෙගමුව ජනපදය**

වර්ග කිලෝමීටර් 37ක් පමණ වන හම්බෙගමුව ජනපදය 2562 ජනගහනයකින් සමන්විත වේ (තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, 2019). මිරිදිය ධීවර කර්මාන්තය ප්‍රජාවගේ ප්‍රධාන ජීවනෝපාය වන අතර හම්බෙගමුව වැව, දෙමෝදර වැව, මහකරමැටිය වැව ආශ්‍රිත ව ධීවර කර්මාන්තය කේන්ද්‍රගත ව පවතී. ධීවර කර්මාන්තය නගා සිටුවීම සඳහා ධීවර සමුපකාර සමිති ක්‍රියාත්මක වුවත් ඒවායේ පවතින අකාර්යක්ෂමතාව මත ධීවර ප්‍රජාවගේ අවශ්‍යතා හා ගැටලු සඳහා ඍජු සම්බන්ධීකරණයක් නොවන බව ප්‍රතිචාරක මතය විය. දේශපාලනීකරණය හා ධීවර පන්ති ක්‍රමයක් ගම්මානයෙහි ස්තරායනගත වීමත් ප්‍රතිලාභ එම පන්ති අතර දෝලනය වීමත් හේතුවෙන් ධීවර ගැටලු විසඳීම ද පන්ති සාධකය මත පදනම් විය. ප්‍රධාන වැව කේන්ද්‍ර කර ගනිමින් නිවාස රටාව බිහි වීමත් එම නිවාස රටාව ඉදිවීමේ පවතින අවිධිමත්භාවය අලි - මිනිස් ගැටුම තුළ පාදක කාරණා වී ඇති බව අනාවරණය විය. මේ හේතුවෙන් සහවේදන ක්‍රමය සෑම විට ම පර්යේෂකයා අනුගමනය කිරීමට පෙලඹීමත් හම්බෙගමුව ජනපදය හම්බෙගමුව ග්‍රාම නිලධාරී වසමෙහි උප ග්‍රාම නිලධාරී වසමක් බවට පත්වීමත් මත අධ්‍යයනය සඳහා පූර්ව පසුබිම නිර්මාණය කරන ලදි. ඒ අනුව හම්බෙගමුව

ග්‍රාම නිලධාරී වසම කේන්ද්‍රීය ගම ලෙසත් හම්බෙගමුව ජනපදය පෝෂක පරිධිය ග්‍රාමය ලෙසත් පර්යේෂකයාගේ අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීමට හේතු සාධක විය.

### අධ්‍යයනය සඳහා හම්බෙගමුව හා හම්බෙගමුව ජනපදය තෝරා ගැනීමට හේතුව

අධ්‍යයනය සඳහා අදාළ ග්‍රාම නිලධාරී වසම් දෙක තෝරා ගැනීමට බලපාන ලද හේතු සාධක කිහිපයකි.

01. තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් අතුරින් අලි - මිනිස් ගැටුමේ තීව්‍රතාව බහුල ව හම්බෙගමුව හා හම්බෙගමුව ජනපදයෙන් අනාවරණය විය (ද්විතීයික දත්ත පරිශීලනයෙන්). මෙම තීව්‍රතාව ජීවිත, දේපොළ හා වගා හානි දක්වා පරාසයක පැතිරුණි. මේ හේතුවෙන් අනෙකුත් ග්‍රාම නිලධාරී වසම් හා සංසන්දනාත්මක කරුණු පිළිබඳ විග්‍රහ කිරීමේ දී ගැටුම් වඩාත් පරාසගත ව මෙම ග්‍රාම නිලධාරී වසම් දෙක තුළින් හඳුනා ගත හැකිවි ය.

02. ජීවනෝපායන්ගේ පැවති සුවිශේෂීතාව, දරිද්‍රතාවෙන් අධික ප්‍රජාවක් අධ්‍යයන ප්‍රදේශ ද්විත්වයෙහි වාසය කිරීම ඉඩම් භුක්ති රටාවේ අවිධිමත්භාවයට ප්‍රධාන සාධකයක් විය. මේ හේතුවෙන් ගැටුමේ න්‍යෂ්ටික පදනම හා උපපරිධිය පද්ධති අතර චලතාව අනෙකුත් ගම්මාන හා සාපේක්ෂ ව අධ්‍යයනය කිරීමේ දී සුවිශේෂී සාධක විය. මේ තත්ත්වය සමස්ත අධ්‍යයන ප්‍රදේශයේ අඩු වැඩි වශයෙන් අනාවරණය කර ගත හැකි වීම සුවිශේෂී කරුණක් විය.

03. හම්බෙගමුව ජනපදය හම්බෙගමුව ග්‍රාමයෙන් නිෂ්පන්න ග්‍රාමයක් වීම, එම නිෂ්පන්න සාධක හේතුවෙන් සංක්‍රමණික ග්‍රාමයක් වීම අධ්‍යයන ප්‍රදේශයේ සුවිශේෂීත්වයක් වේ.

ඉහත දැක්වූ පරිදි ශ්‍රී ලංකාවේ ඌව පළාතේ මොනරාගල දිස්ත්‍රික්කයේ හම්බෙගමුව හා හම්බෙගමුව ජනපදය යන ගම් දෙක මෙම පර්යේෂණයේ අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරා ගනු ලැබුණි.

### විශ්ලේෂණය හා ප්‍රතිඵල

ගැටුමක් ප්‍රචණ්ඩත්වය මත පදනම් වූ සට්ටනයක් ලෙස කරුණාදාස (2003) **"ගැටුම් නිරාකරණයට හැඳින්වීමක්"** නමැති කෘතියෙහි විග්‍රහ කර තිබේ. එවැනි ගැටුමක් දෙපාර්ශ්වයක් අතර හෝ කණ්ඩායම් කිහිපයක් අතර සිදු විය හැකි බවත් එය ක්ෂුද්‍ර ගැටුමක සිට සාර්ව ගැටුමක් දක්වා දිශාගත වීම සඳහා ගැටුමේ අභිලාෂ ප්‍රමුඛ වන බව අර්ථකථනය කර ඇත. පර්යේෂකයා අලි - මිනිස් ගැටුම මෙම අර්ථකථනීය විශ්ලේෂණ ප්‍රමුඛ කරගනිමින් අධ්‍යයන ප්‍රදේශයේ ගැටුමේ ස්වරූපය පදනම් සාධකය ලෙස යොදා ගනිමින් තේමා පහක් යටතේ විග්‍රහයට ලක් කරයි.

අ. කුටුම්බයෙහි පුමතිරිභාවය හා ගැටුම අතර සහසම්බන්ධතා රටාව

ආ. ආදායම් ව්‍යාප්තියේ ස්වභාවය, ප්‍රජනන පවුල බිහිකර ගැනීම හා ඉඩම් භුක්තියේ ස්වභාවය

ඇ. අධ්‍යාපන අවස්ථාව හා අලි - මිනිස් ගැටුම අතර පවතින ඌනපූරක සම්බන්ධතාව

ඈ. ගැටුම සඳහා පදනම් වී ඇති සාධක හා එම ගැටලු වර්ධනය වීමට බලපා ඇති සාධක

ඉ. ගැටුම අවම කිරීම සඳහා මෑතකාලීන ව ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ඒවා අසාර්ථක වීමට බලපා ඇති සාධක

## කුටුම්බයෙහි පුමතිරිභාවය හා ගැටුම අතර සහසම්බන්ධතා රටාව

අධ්‍යයන දත්ත අනාවරණය කරන පරිදි පුමතිරිභාවය හා ගැටුම අතර ඍජු සම්බන්ධතාවක් දැකගත හැක. විශේෂයෙන් ම මෙම සම්බන්ධතාව ගැටුමත් සමග ජීවිත හානි අධ්‍යයන ප්‍රදේශයේ සිදුවී ඇති ආකාරයෙන් අනාවරණය කර ගත හැකි විය. හම්බෙගමුව ග්‍රාමයෙහි අධ්‍යයනයට ලක් වූ ප්‍රතිචාරකයන්ගේ දත්ත අනාවරණය කරන පරිදි අලි - මිනිස් ගැටුම හේතුවෙන් ජීවිත හානි 51ක් සිදු වී ඇත. එය ස්ත්‍රීන් 12ක් හා පුරුෂයන් 39ක් වශයෙනි. හම්බෙගමුව ජනපදයෙහි මෙම සංඛ්‍යාව 45ක් වු අතර පුරුෂයන් 23 ක් හා කාන්තාවන් 22ක් ගැටුම හේතුවෙන් ජීවිත හානියට පත් වී ඇති බව අධ්‍යයන දත්ත අනාවරණය කරයි. එය සමස්ත නියැදියට අනුව 29.8%ක් විය. ජීවිත හානි ලෙස මෙහි දී අනාවරණය කර ගනු ලැබුවේ මරණයට පත් වීම, අර්ධ ආබාධිත තත්ත්වයට පත් වීම හා පූර්ණ ආබාධිතයන් බවට පත්වීම වේ. පුමතිරිභාවය යන සාධකය ගැටුම සමග ඍජු දායකත්වයක් පවතින අතර මානව ජන ජීවිතයේ ජීවත්වීමේ අයිතිය අහිමි කර ඇත. කෘෂි ජීවිතය පුමතිරිභාවය නමැති සංකල්පය සමග තදාත්මීකරණය වී ඇති අතර එම කාරණය කුටුම්බයෙහි පුද්ගලයාගේ අයිතිවාසිකම් අහිමි වීමක් මෙන් ම දෛනික කාර්යභාරයන් ව්‍යාකූල වීමට හේතු වී තිබේ. කුටුම්බයේ සාමාජිකයන්ගේ අහිමි වීම කුටුම්බයේ කාර්යභාරය බිඳ වැටීමට හේතු වී ඇති බව අනාවරණය කළ හැකි ය. කාන්තා ගෘහ මූලික පවුල් බිහිවීම හේතුවෙන් පවුලේ වැඩිමහල් පිරිමි දරුවන්ට කුටුම්බ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා දායක වීමට සිදු වීම, කාන්තාව පුරුෂයාගේ ආර්ථික කාර්යභාරය සඳහා අනුගත වීමට සිදු වීම හේතුවෙන් නව කුටුම්බ සංස්කෘතියක් නිර්මාණය වී ඇති බව අනාවරණය විය. මේ හේතුවෙන් අනුවර්තනීය කුටුම්බ ඒකකයෙහි කාන්තාව **"ඡායා පුරුෂයෙක්ගේ කාර්යභාරය"** සඳහා අනුගත වීමක් සිදු වී ඇති බව සනාථ කළ හැකි ය. අලි - මිනිස් ගැටුම හේතුවෙන් කාන්තාවගේ කාර්යභාරය අහිමි වීම (මරණයට පත්වීම, ආබාධිත වීම) පුරුෂයා කුටුම්බයෙහි කාන්තා හා පුරුෂ භූමිකා ද්විත්වයම භූමිකාගත කිරීමට සිදුවීම නිසා නව අනුවර්තනීය කුටුම්බ ඒකක නිර්මාණය වී ඇත. විශේෂයෙන් ම ගෘහීය කටයුතු හා ආර්ථික කාර්යභාරය සඳහා නව සංස්කෘතියකට කුටුම්බය තුළ අනුගත වීමට සිදුවීමත් **"ඡායා කාන්තා කාර්යභාරය"** නිලීන ව ආරෝපණය

වීමත් හේතුවෙන් පුරුෂයා කුටුම්බයෙහි බහුවිධ සේවා සපයන්නෙක් බවට පත් වී ඇති බව අනාවරණය කළ හැකිය. ගෘහීය කටයුතු සඳහා ගෘහ මූලිකයාට දෛනික ව නිරත වීමට නොහැකි අවස්ථාවන්හි දී කුටුම්බයේ වැඩිමහල් ගැහැණු දරුවන් මවගේ කාර්යභාරය සඳහා අනුගත කිරීමක් හඳුනා ගත හැකි විය. මේ හේතුවෙන් වැඩිමහල් ගැහැණු ළමුන් ''**ආරෝපිත මවක්**'' බවට පත්වී ඇති බව අනාවරණය කළ හැකි ය. මෙම නව සංස්කෘතික වෙනසියාව භූමිකා ගැටුම් හා මනෝසාමාජීය ගැටලු නිර්මාණය වීමටත් අවශ්‍ය පසුබිම් සාධක ගොඩනංවා ඇති බව අධ්‍යයන දත්ත මගින් සනාථ කළ හැකි ය. එනම් පාසල් අධ්‍යාපනයේ **"ශිෂ්‍යයා"** යන තත්ත්ව සාධකය ගෘහීය හා ආර්ථික කටයුතු සඳහා කෙටි කාලීන මෙන් ම දිගු කාලීන ව යෙදවීම නිසා නව තත්ත්ව සාධක (ආර්ථික උපයන්නා, ගෘහීය කටයුතුවල නිරත වන්නා) ප්‍රතිනිර්මාණය කිරීමක් සිදු වී ඇත.  මෙම කාරණා පිළිබඳ අවධානය යොමු කිරීමේ දී කුටුම්බ සාමාජිකයන්ගේ පුමතිරිභාවය යන සාධකය හා ගැටුම අතර ඍජු සම්බන්ධතාවක් මෙන් ම ගැටුමේ පූර්වෝක්ති සාධක බිහි කිරීමට අවශ්‍ය පසුබිම නිර්මාණය වීමට අවකාශය සැලසී ඇති බව අනාවරණය වේ.

අධ්‍යයන ක්ෂේත්‍රයේ ප්‍රතිචාරකයන්ගේ අධ්‍යාපන මට්ටම ඔවුන්ගේ සමාජ සංස්කෘතික ජන ජීවිතය තිරණය කිරීමේ සාධක වේ. අධ්‍යාපන අවස්ථා හා ගැටුම අතර ඌනපූරක සම්බන්ධතා දැකිය හැකි අතර එය ජීවනෝපායන්හි සචලතාවට හේතු වී ඇත. එනම් අධ්‍යයන දත්ත අනාවරණය කරන පරිදි අධ්‍යයන ක්ෂේත්‍රයෙහි මිරිදිය ධීවර කර්මාන්තය හා කෘෂිකාර්මික සේවා නියුක්තිය බහුල වීමත් එහෙයින් පරිසර සාධකය සමග අධ්‍යාපන අවස්ථා ද අවම වීම ගැටුමේ පූර්වෝක්ති සාධක වේ. අධ්‍යයන ප්‍රදේශයේ ප්‍රතිචාරකයන්ගේ අධ්‍යාපන මට්ටම සලකා බැලීමේ දී මූලික අධ්‍යාපනය ලැබූවන්ගේ ප්‍රතිශතය ඉහළ අගයක් ගෙන ඇත. සමස්ත නියැදියට අනුව එය 85%ක් වේ. ඉහළ අධ්‍යාපන අවස්ථා සඳහා පුද්ගලයන් නොපෙලඹීමට හේතු සාධක ලෙස අනාවරණය වූයේ ග්‍රාමීය පරිසර සාධකය යි. එනම් ධීවර කර්මාන්තය හා කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපායන් වීමත්, එම කර්මාන්තයන්හි සාම්ප්‍රදායික ව නියුක්ත වීම සඳහා තල්ලු කිරීමේ සාධයකන් අධ්‍යයන ප්‍රදේශයේ පරිසරය තුළින් නිර්මාණය වීම ඉහළ අධ්‍යාපන අවස්ථා සඳහා පෙලඹීම අවම කිරීමේ සාධකයෝ වෙති. එහෙයින් පරිසර සාධකය අධ්‍යාපනයේ සාධිත තත්ත්වය තීරණය කරනු ලබන ප්‍රධාන සංරචකයක් වී ඇති බව අනාවරණය විය. එමෙන් ම අ.පො.ස (සා.පෙළ) දක්වා අධ්‍යාපනය ලබා ඇති ප්‍රතිචාරකයන් සංඛ්‍යාව 10%ක් වේ. ස්වකැමැත්ත මත නොව ගුරුවරුන්ගේ හා දෙමාපියන්ගේ ආයාචනය මත අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සඳහා ළමුන් ඉදිරිපත් වන බව අවිධිමත් හා කේන්ද්‍රගත සම්මුඛ සාකච්ඡාවලින් අනාවරණය විය. අ.පො.ස උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලබා ඇති ප්‍රතිචාරකයන් සංඛ්‍යාව මුළු නියැදියට අනුව 4%ක් වේ. අධ්‍යාපනය හදාරන ප්‍රතිචාරකයන් 1%ක් පමණ අනාවරණය


වූ අතර ඔවුහු අ.පො.ස (සා.පෙළ) හා අ.පො.ස (උසස් පෙළ) විභාගය සඳහා අධ්‍යයන කටයුතුවල නිරත වන්නෝ වූහ.

### ආදායම් ව්‍යාප්තියේ ස්වභාවය, ණය ලබා ගැනීම හා කුටුම්බ කෘත්‍යයන් බිඳ වැටීමට හේතු සාධක

### ආදායම් ව්‍යාප්තියේ ස්වභාවය

පුද්ගලයකුගේ ක්‍රය ශක්තිය තීරණය කරනු ලබන ප්‍රධාන ම සාධකයක් ලෙස ආදායම් තත්ත්වය දැක්විය හැකි ය. ක්‍රය ශක්තිය මත පුද්ගලයකුගේ මූර්ත අගය තීරණය කරනු ලබන අතර ඔහුගේ සකසුරුවම්කම, පරිභෝජන අවශ්‍යතා හා ප්‍රතිෂ්ඨාපන අවශ්‍යතා සංකේන්ද්‍රණය වේ (ශ්‍රී ලංකා මහබැංකුව, 2020). අධ්‍යයන ප්‍රදේශයේ ප්‍රතිචාරකයන්ගේ ආදායම් ව්‍යාප්තියේ විචලතාව පහත පරිදි විසරණය වී ඇත.

ප්‍රස්ථාර අංක 01: *ප්‍රතිචාරකයන්ගේ ආදායම් ව්‍යාප්තියේ ස්වභාවය*




මූලාශ්‍රයඃ- ක්ෂේත්‍ර අධ්‍යයනය, 2020/2021

අධ්‍යයන ප්‍රදේශයේ ප්‍රජාවගේ ආදායම් වර්ගීකරණයේ දී මධ්‍ය ආදායම් ලබන කාණ්ඩයේ වර්ධනයක් දැකිය හැකි අතර කුටුම්බයෙහි අව ම සාමාජිකයන් දෙදෙනෙක්ගේ ඓක්‍යයෙන් එම ආදායම් කාණ්ඩය නිර්මාණය වී ඇති බව අනාවරණය විය. කුටුම්භ ආදායම් කාණ්ඩකරණය තුළ මහබැංකුව විසින් හඳුන්වා දී ඇති වාර්ෂික වාර්තාවලට අනුව රු. 25000 - 45000ත් අතර මාසික ආදායමක් උපයන පවුල් මධ්‍ය ආදායම් ලබන කාණ්ඩය ලෙස වර්ගීකරණය කර ඇති අතර(ශ්‍රී ලංකා මහබැංකුව, 2020) එය සමස්ත නියැදියට අනුව 57.2

% (184)ක් වේ. මෙම ආදායම් කාණ්ඩයට රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්, හේන් ගොවිතැන්වල නිරත වූවන් හා ස්වයං රැකියාවන්හි නියුක්ත වූවන් අයත් වේ. රාජ්‍ය සේවයේ නිරත ප්‍රජාව හැර අනෙකුත් රැකියාවන්හි නියුක්ත වූවන් සචලතා ආදායම් ලබන කාණ්ඩය නියෝජනය කරන අතර මාස 06ක ආදායම්හි විචලතාව මත මෙම ගණනය කිරීම සිදු විය. විශේෂයෙන් ම කේන්ද්‍රගත සම්මුඛ සාකච්ඡා හා අවිධිමත් සාකච්ඡාවලින් අනාවරණය වූ පරිදි අලි වගාවන්ට හානි නොකළේ නම් මෙම ආදායම් දෙගුණයකින් ඉහළ නංවා ගැනීමට හැකියාව ලැබුණු බව දත්තදායකයන්ගේ අදහස විය. ඒ අනුව ආදායම් කාණ්ඩය තුළ උච්චාවචනයේ කේන්ද්‍රීය සාධකයක් බවට අලි - මිනිස් ගැටුම පත් ව තිබේ.

අධ්‍යයන නියැදියට අනුව 5001 - 20000 අතර ආදායම් කාණ්ඩය නියෝජනය කරන ප්‍රතිචාරකයන් සංඛ්‍යාව 33.5% (108)ක් වේ. කුටුම්බ ආදායම් වර්ගීකරණයෙහි එම ආදායම් කාණ්ඩය නියෝජනය කරන ප්‍රජාව අඩු ආදායම්ලාභීන් ලෙස හඳුන්වා දී ඇත (ශ්‍රී ලංකා මහබැංකුව, 2020). අධ්‍යයන දත්ත අනාවරණය කරන පරිදි ධීවර කර්මාන්තයේ හා කම්කරු වෘත්තීයේ නියුක්ත වූවෝ මෙම කාණ්ඩය නියෝජනය කරති. මෙම ආදායම් කාණ්ඩය දෛනික වේතන ලබන ප්‍රතිලාභීන් වීම විශේෂ කාරණයක් වේ. දෛනික ව කම්කරු රැකියාවන් ද නොමැති අතර කම්කරු සේවයේ නියුක්ත වූවෝ හේන් ගොවිතැන, වී ගොවිතැන හා අවිධිමත් ධීවර රැකියාවන්හි නියුක්ත වෙති. කේන්ද්‍රගත සාකච්ඡාවලින් අනාවරණය වූ පරිදි දෛනික ව කුලී රැකියාවන්හි නියුක්ත වීමට නොහැකි සේවා මුරය පෙ.ව. 10.00 - ප.ව. 4.00ත් කාණ්ඩය මේ අංශය නියෝජනය කරති. ඊට හේතුව ලෙස අනාවරණය වූයේ පෙරවරු කාලයේ දී හා සන්ධ්‍යා කාලයේ දී රක්ෂිතයේ (උඩවලව) කොරිඩෝව හරහා අලීන් ගම්මානයට හා වගා ඉඩම් සඳහා ප්‍රවේශ වීම යි. මේ හේතුවෙන් දෛනික වේතනය සඳහා පුද්ගලයෙක්ට රු.750 - 1000ත් මුදලක් ලැබේ. දෛනික වේතනවල උච්චාවචනය සඳහා ඍජු දායකත්වයක් අලි - මිනිස් ගැටුමෙහි අන්තර්ගත වී ඇති බව අනාවරණය කළ හැකි ය.

ආදායම් කාණ්ඩකරණයේ රු.5000 අඩු මාසික ඉපයීම් සිදු කරන ප්‍රතිචාරකයන් සංඛ්‍යාව 5.6% (18)ක් වේ. මූලික අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ප්‍රමාණවත් මාසික ආදායමක් නොලබන මෙම ප්‍රජාව දෛනික වේතන නොලබන කඩින් කඩ වේතන ලබන කාණ්ඩයට අයත් වන බව අධ්‍යයනය මගින් අනාවරණය විය. කම්කරු වෘත්තියේ නිරත දෛනික ව රැකියාවේ නිරත නොවන කාණ්ඩය මෙම ආදායම් වර්ගීකරණය නියෝජනය කරති. විශේෂයෙන් ම සමෘද්ධිය, මහජන ආධාර වැනි රාජ්‍ය අංශයෙහි සුබසාධන පහසුකම් ලබන නිදන්ගත රෝගයන්ගෙන් පෙළෙන පුද්ගලයන් ද මෙම ආදායම් කාණ්ඩයට අයත් වන අතර රෝගී තත්ත්වය හේතුවෙන් දෛනික ව රැකියාවන්හි නියුක්ත වීමට නොහැකි බව අනාවරණය විය.

රු.50000 වැඩි ආදායම් කාණ්ඩය නියෝජනය කරන ප්‍රතිචාරකයෝ මුළු නියැදියට අනුව 3.7% (12)ක් වන අතර ඔවුහු පෞද්ගලික අංශයේ සේවා නියුක්ත හා වී ගොවිතැන්හි නිරත ප්‍රජාව වේ. මහා පරිමාණ වී ගොවිතැන් (අක්කර 25ට වැඩි) කටයුතුවල නිරත ව්‍යාපාරික කෘෂිකර්මාන්තයෙහි නියුක්ත වූවෝ හා වී මෝල් හිමියෝ ද මෙම ආදායම් කාණ්ඩය නියෝජනය කරන ආදායම්ලාභීහු වෙති.

ආදායම් වර්ගීකරණය තුළ අධ්‍යයන ප්‍රදේශයේ බහුතර ප්‍රතිචාරකයන් ආදායම් කාණ්ඩකරණය මගින් විහීනතා උගුලකට හසු ව ඇති බව අනාවරණය කළ හැකි ය. විශේෂයෙන් ම දරිද්‍රතාව කේන්ද්‍රීය ගැටලුවක් බවට පත් ව ඇති අතර දරිද්‍රතා සාධකය නිසා බලරහිතභාවය, අවධානමට ලක් වීම හා හුදකලාභාවය නමැති විහීනතා උගුල තුළ සංරචක ශක්තිමත් වී ඇත. මෙම සංරචක කේවල මෙන් ම සමුච්චිත වශයෙන් ශක්තිමත් කරන බව අධ්‍යයන දත්ත පරීක්ෂා කිරීමේ දී සනාථ කළ හැකි ය. මෙය දිග්ගැස්සුණු සමාජ ගැටුමෙහි **"සැඟවුණු සාධක"** නමැති සංකල්පය සමග අන්තර් පරායත්තතාවක් නිර්මාණය වන බව අනාවරණය කළ හැකි ය (බලන්න න්‍යායික විශ්ලේෂණය). විශේෂයෙන් ම ප්‍රතිචාරක ආදායම් කාණ්ඩකරණය තුළ උච්චාවචන ආදායම් ලැබීමත් එය පුද්ගලයාගේ ක්‍රය ශක්තිය වෙනසියාවට ලක්වීමටත් අලි - මිනිස් ගැටුම නිලීන සාධක වී ඇත. මෙම නිලීන සාධක යනු දිග්ගැස්සුණු සමාජ ගැටුමෙහි සැඟවුණු සාධක වන අතර ගැටුමේ සැඟවුණු සාධකය ආදායම් ආන්තීකරණයක් පුද්ගලයා තුළ නිර්මාණය වීම යි.

## ප්‍රතිචාරකයන් ණය ලබා ගැනීම සඳහා හේතු වූ කාරණා

ග්‍රාමීය අංශයෙහි දරිද්‍රතාවේ කේන්ද්‍රීය සාධකයක් ලෙස කුටුම්බ ණය ලබා ගැනීම ඉහළ යාම නමැති සාධකය දැක්විය හැකි ය ( Chambers, 1983). මේ හේතුවෙන් ග්‍රාමීය ප්‍රජාව ණය උගුලකට හසු වී ඇති අතර එය ඔවුන්ගේ කුටුම්බ සුභසාධනය පහළ වැටීමට හේතු වී ඇත. විශේෂයෙන් ම සම්පත් කළමනාකරණයේ පවතින අකාර්යක්ෂමතාව හා සම්පත් උපයෝජනයේ පවතින දුර්වලතාව ණය උගුලකට පුද්ගලයා හසු වීම සඳහා හේතු වී ඇති බව අනාවරණය කරයි. අධ්‍යයන ප්‍රදේශයේ ප්‍රජාව ද ණය ලබා ගැනීම සඳහා ශීඝ්‍රයෙන් පෙලඹී ඇති අතර එය කුටුම්බය තුළ සුභසාධනය හා ආරක්ෂණ අවශ්‍යතා අතර පරාසගත විය. ප්‍රතිචාරක ප්‍රජාව ණය ලබා ගැනීම සඳහා පෙලඹවීමේ කාරණා පහත පරිදි වගු සටහන් අංක 01 මගින් දැක්විය හැක.

වගු අංක 02: *ණය ලබා ගැනීම සඳහා ප්‍රතිචාරකයා අභිප්‍රේරණය කළ සාධක*

| කාරණය | හම්බෙගමුව | ප්‍රතිශතය | හම්බෙගමුව ජනපදය | ප්‍රතිශතය | සමස්ත ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| සඳහන් කර නොමැත | 2 | 1.0 | 0 | 0 | 0.6 |
| වගා කටයුතු | 62 | 32.0 | 36 | 28.1 | 30.4 |
| අධ්‍යාපන කටයුතු | 14 | 7.2 | 11 | 8.6 | 7.8 |
| අලි වැට ඉදි කිරීම | 104 | 53.6 | 71 | 55.5 | 54.3 |
| පරිභෝජන කටයුතු | 10 | 5.2 | 6 | 4.7 | 5.0 |
| සෞඛ්‍ය කටයුතු | 2 | 1.0 | 4 | 3.1 | 1.9 |
| මුළු සංඛ්‍යාව | 194 | 100 | 128 | 100 | 100 |

මූලාශ්‍රයඃ- ක්ෂේත්‍ර අධ්‍යයනය, 2020/2021

අධ්‍යයන ප්‍රදේශයේ ප්‍රජාවගේ කේන්ද්‍රීය ගැටලුව බවට අලි මිනිස් ගැටුම පත්වීමත් ගැටුම තාවකාලික සමථනය සඳහා අලි වැට ඉදි කිරීම විසඳුම් ක්‍රියාවලියේ ප්‍රධාන ම සාධකයක් විය. රාජ්‍ය අංශය මගින් අලි වැට ඉදි කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබුණත් එය නිසි පරිදි නඩත්තු නොවීම හා රාජ්‍ය අංශයේ නිලධාරීකරණ ගැටුම විසඳීම සඳහා ශක්‍යතා පූර්වක ක්‍රියාවලියක් අනුගමනය නොකිරීම හේතුවෙන් ගැටුම දිග්ගැස්සුණු සමාජ ගැටුමක් බවට පත් වී ඇති බව අනාවරණය විය. මේ හේතුවෙන් ගැටුම විසඳීම සඳහා ප්‍රජාව තම ගෘහය හා ඉඩම් වටා පෞද්ගලික ව විදුලි වැට ඉදි කිරීම සඳහා කටයුතු කර ඇත. විදුලි වැට ඉදි කිරීම සඳහා දෛනික වේතන ඉහළ යාම හා අමුද්‍රව්‍ය මිල දී ගැනීමට අධික මිලක් වැය වීම හේතුවෙන් ප්‍රජාව ණය ලබා ගැනීම සඳහා පෙලඹී ඇති බව අනාවරණය විය. එය ඔවුන්ගේ දෛනික පාරිභෝජන අවශ්‍යතා මෙන් තුන් ගුණයක් වන බව අනාවරිත දත්ත මගින් සනාථ කළ හැකි ය. මෙම කාරණය ප්‍රතිචාරකයන්ගේ පහත කේන්ද්‍රගත සම්මුඛ සාකච්ඡාව මගින් අනාවරණය වේ.

| රාමු අංක 01<br><br>කේන්ද්‍රගත සම්මුඛ සාකච්ඡා අංක 01 - ගොවිතැන් හා මිරිදිය ධීවර කර්මාන්තයේ නිරත පුරුෂයන්, හම්බෙගමුව/ හම්බෙගමුව ජනපදය |
|---|
| *වනජීවී එකේ නිලධාරී මහත්තුරු ගමේ අලි වැට කැඩුණහ ම එන්නෙත් නැහැ. හැමදා ම පැමිණිලි කරලත් එන්නේ නැහැ. බෝලෙ පාස්කර කරලා අර මහත්තයා ළඟට යන්න අර* |

*මිස් හමුවෙන්න කියලා වැඩේ පරක්කු කරනවා. කොච්චර කිව්වත් ඒ අයට අපේ ප්‍රශ්නෙ ගාණක්වත් නැහැ. වැට හදන්න එන්නේ එක්කෝ අලි ඇවිත් ගමේ වගාවන්ට හරි මිනිහෙක් මැරුණොත් විතර යි. ඒක නිසා අපි අපි ම දූන් වැට ඉදි කරගෙන යන්නේ. සාමාන්‍යයෙන් එක් කෙනෙක්ට වැට තනියෙන් හදාගන්න රු.50000ක් විතර යනවා. ඒ වගේ ම වැට හදන්න එන අයට කෑම දෙන්නත් ඕන. හවසට බොන්න දෙන්නත් ඕන. අපිට මේ වියදම් දරන්න අමාරු යි. අපේ මාසෙකට ගෙදරකට යන වියදම වගේ දෙගුණ තුන් ගුණයක් යනවා මේ වැඩේට. ඒක නිසා කොහොම වුණත් මේ අලින්ගෙන් අපි පරිස්සම් වෙන්නත් අපේ වගාවන් ආරක්ෂා කරගන්නත් ඕන නිසා ණය වෙලා අලි වැට ගහගන්නවා. අපි රත්තරන් බඩු උගස් තියලා හරි පොලී මුදලාලිගෙන් 20% පොලියට හරි සමෘද්ධියෙන් ණය අරගෙන හරි තමයි මේ වැඩේ කරන්නේ. වනජීවී එක හරියට මේ ප්‍රශ්නෙ විසඳුව නම් අපි මේ විදියට ණය ගන්න ඕනේ නැහැනේ.*

මූලාශ්‍රය : ක්ෂේත්‍රීය අධ්‍යයනය, 2020/2021

වී ගොවිතැන හා හේන් ගොවිතැන ප්‍රධාන ජීවනෝපායන් බවට පත් කර ගත් මෙම ප්‍රජාව කෘෂිකර්මාන්තයෙන් යැපීම සිදු වේ. කෘෂිකර්මාන්තය සඳහා පුනරාවර්තන වියදම් දෛනික ව උච්චාවචනය වීමත් ආම්පන්න නඩත්තු කිරීම සඳහා විශාල වියදමක් දැරීමට සිදුවීමත් හේතුවෙන් ණය ලබා ගැනීම සඳහා ප්‍රජාව පෙලඹී ඇති බව අනාවරණය විය. එය සමස්ත නියැදියට අනුව 30.4%ක් වේ. මූල්‍ය උද්ධමනය, වෙළඳපොළෙහි ආරක්ෂණ යාන්ත්‍රණ ක්‍රියාත්මක නොවීම හා තරගකාරීත්වය යන සාධකවල විචලතාව හා ආදායම් උච්චාවචනය යන සාධක ප්‍රජාව වගා කටයුතු සඳහා ණය ලබා ගැනීමට පෙලඹී තල්ලු කිරීමේ සාධකයෝ වෙති. වගාවලින් ලැබෙන ආදායම හා වර්තන වියදම් අතර සෘණාත්මක සම්බන්ධතාව ණය උගුලකට පුද්ගලයා හසුවීමට බල පෑ ප්‍රදාන කාරණයන් විය. විශේෂයෙන් ම වගා බිම උකස් කිරීම, තම ගෘහය උකස් කිරීම හා වගා බිමේ පලදාව උකස් කිරීමෙන් වගා කටයුතු සිදු කරන බව අනාවරණය විය. මේ හේතුවෙන් ආදායම හා වියදම අතර සෘණාත්මක පරතරය පුද්ගලයා විහීනතා උගුලකට හසු කිරීමට හේතු වී ඇත (බලන්න සාහිත්‍ය විමර්ශනය තුළ බණ්ඩාරගේ අදහස).

අධ්‍යයන ප්‍රදේශ ද්විත්වයේ ප්‍රජාව ණය ලබා ගැනීම සඳහා බලපා ඇති තල්ලු කිරීමේ සාධකයක් ලෙස අධ්‍යාපන කටයුතු සඳහා වියදම් දැරීමට සිදු වීම දැක්විය හැකි ය. පාසල් උපකරණ මිලදී ගැනීම, උපකාරක පන්ති සඳහා වියදම් දැරීම, පාසලේ උත්සව අවස්ථා සඳහා වියදම් දැරීම යන කාරණ මෙහි දී ප්‍රමුඛ වේ. සිද්ධි අධ්‍යයන හා අව්‍යිමත් සාකච්ඡා මගින් අනාවරණය වූ පරිදි අලින් විසින් හානි කරන ලද පාසලේ ගොඩනැගිලි හා විනාශ කරන ලද වගා කටයුතු යාවත්කාලීන කිරීම සඳහා පාසල් සංවර්ධන කමිටුව දෙමාපියන්ගේ මූල්‍ය

දායකත්වය මත යැපීම සිදු වී ඇත. එය පහත සඳහන් ප්‍රත්‍යේක අධ්‍යයන මගින් සනාථ කළ හැකි ය.

*නිමල් හම්බෙගමුව ජනපදයේ වාසය කරන අවුරුදු 45 වයසැති මිරිදිය කර්මාන්තයේ නිරත පුද්ගලයෙක් වේ. ඔහුගේ සඳහන් කරන පරිදි හම්බෙගමුව ජනපදයේ ප්‍රාථමික පාසල වන රතඹලාගම කණිෂ්ට විද්‍යාලයේ තාප්පය, ප්‍රධාන ශාලාව හා කෘෂිකාර්මික වගාවන් අලීන් විසින් විනාශ කළ බවත් ඒ සඳහා පාසල් ශිෂ්‍යයෙක්ගෙන් රු. 3000 මුදලක් අය කළ බවත් සඳහන් කරයි. ආර්ථික හා මූල්‍යමය දරිද්‍රතාවයෙන් පෙළෙන ප්‍රජාවක් ජීවත්වන මෙම ප්‍රදේශය තුළ කුටුම්බ ආදායමෙන් පාසලේ භෞතික අවශ්‍යතා යාවත් කාලීන කිරීම සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවීම නිසා ණය උගුලකට හසුවීමට සිදුව බව අනාවරණය කරයි. අලි-මිනිස් ගැටුම සමග දෛනික රැකියා බිඳවැටීම මූල්‍ය අස්ථාවරත්වයට හේතු වූ බවත් එමනිසා කුටුම්බ සාමාජිකයන්ගේ ස්වර්ණාභරණ උකස් කර පාසල් ගොඩනැගිලි පිළිසකර කිරීමට මුදල් ලබාදී ඇති බවත් මොහුගේ ප්‍රත්‍යේක අධ්‍යයනය මගින් අනාවරණය විය* ( ප්‍රත්‍යේක අධ්‍යයනය අංක 01, 2020/2021**)**.

අධ්‍යාපන පුනරාවර්තන වියදම් පාසලේ භෞතික වත්කම් ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා දැරීමට සිදු වීම හේතුවෙන් ප්‍රජාව ආර්ථික සාධකය මගින් ආන්තීයකරණයට ලක් වී ඇති බව අනාවරණය වේ. විශේෂයෙන් ම අධ්‍යාපන වියදම් අලි-මිනිස් ගැටුමේ ප්‍රකට කෘත්‍ය තුළ අනාවරණය වීම, වින්දිත අනෝමීය කණ්ඩායමක් බවට පත්වීමට අවශ්‍ය පූර්ව සාධක නිර්මාණය කර ඇත. කුටුම්බ ආදායම තුළ මූල්‍ය වත්කම් කුටුම්බයේ අවශේෂ සුබසාධන කටයුතු සඳහා වෙන් කිරීමට නොහැකි වීම නිලීන සාධක වීමත් එම නිලීන සාධක හා පුද්ගලයාගේ ආදායම අතර අනුලෝම සම්බන්ධතාවයක් පැවතීම ආර්ථික සාධකය තුළින් අනෝමීයත්වයට පත්වීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කර ඇත.

දෛනික පරිභෝජන අවශ්‍යතා සඳහා අධ්‍යයන ප්‍රදේශයේ ප්‍රජාව ණය ලබා ගැනීම සඳහා පෙලඹී ඇති බව අනාවරණය කළ හැකි ය. සමස්ත නියැදියට අනුව එය 5%ක් වේ. කෘෂිකාර්මික හා අලි වැට ඉදිකිරීම සඳහා කුටුම්බ ආදායමෙන් විශාල මුදලක් වැය වීම හේතුවෙන් දෛනික පරිභෝජන අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා පුද්ගලයා ණය ලබා ගැනීම සඳහා පෙලඹී ඇත. විශේෂයෙන් ම පරිභෝජන අවශ්‍යතා ඉටු කිරීම සඳහා පුද්ගලයා ණය ලබා ගැනීමට පෙළඹීම ගැටුමේ වක්‍ර සාධකයක් වේ. මේ හේතුවෙන් මූලික අවශ්‍යතා මගින් ප්‍රජාව ආන්තීකරණයට ලක් වී ඇති බව සනාථ කළ හැකි ය.


පුද්ගලයකුගේ කායික හා මානසික නිරෝගී සුවය සඳහා සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම සෞඛ්‍ය සම්පන්න ජීවිතය දෛනික කාර්යයන් මනාව පවත්වා ගෙන යාම සඳහා සාධණීය පසුබිමක් ගොඩනංවයි. කුටුම්බයෙහි නිදන්ගත රෝගවලින් පෙළෙන වැඩිහිටියන් හා කායික හා මානසික ආබාධවලට ලක් වී ඇති කුටුම්බයේ සාමාජිකයන්ගේ සෞඛ්‍ය අවශ්‍යතා ඉටු කිරීමට පුද්ගලයා ණය ලබා ගැනීමට පෙලඹී ඇත.

මේ හේතුවෙන් සිය කායික හා මානසික අවශ්‍යතා සංතෘප්ත කර ගැනීම සඳහා ණය මත යැපීමට සිදු වී ඇති බව අනාවරණය කළ හැකි ය.

## කුටුම්බ කාර්යය බිඳ වැටීම සඳහා අලි - මිනිස් ගැටුම බලපා ඇති ආකාරය

අලි - මිනිස් ගැටුම කුටුම්බයෙහි දුෂ්කෘත්‍යමය කාර්යාවලියක් බිහි කිරීමට අවශ්‍ය හේතු සාධක සපයා ඇති බව අධ්‍යයන දත්තවලින් අනාවරණය වෙයි. ප්‍රාථමික හා ද්විතීයික අවශ්‍යතා බිඳ වැටීම, බිඳුණු පවුල් පරිසරයක් නිර්මාණය වීම හා කුටුම්බ සංශක්තිය වියුක්ත වීම ගැටුමේ ප්‍රකට හා නිලීන කෘත්‍යයන් ලෙස අනාවරණය කළ හැකි ය. එය පහත ප්‍රස්තාර සටහන මගින් විග්‍රහ කළ හැකි ය.

ප්‍රස්ථාර අංක 02: *අලි -මිනිස් ගැටුම කුටුම්බ ක්‍රියාකාරීත්වය සඳහා සිදුකර ඇති බලපෑම*




මූලාශ්‍රයඃ- ක්ෂේත්‍ර අධ්‍යයනය, 2020/2021

කුටුම්බයෙහි ගෘහ මූලිකයා වගා ආරක්ෂා කර ගැනීම සඳහා රාත්‍රී මුර සේවයේ යෙදීම නිසා ගෘහ කුටුම්බය සාමාජිකයන්ගේ ආරක්ෂණ යාන්ත්‍රණය ව්‍යුත්පන්න වී ඇති බව අධ්‍යයන දත්ත මගින් සනාථ කළ හැකි ය. මේ හේතුවෙන් මූලික ගෘහ කුටුම්බයේ බිරිඳ හා දරුවන් හුදකලා වන අතර එය ලිංගික අභිප්‍රේරණය සඳහා සෘජු බලපෑමක් සිදු කර ඇති බව අනාවරණය කළ හැකි ය. අධ්‍යයන දත්ත අනාවරණය කරන පරිදි එය 24% ක් වේ. මේනිසා කුටුම්බ කාර්යය ව්‍යුත්පන්න වීමත් දරුවන් බිහි කිරීමට අවශ්‍ය කාල වකවානු දීර්ඝ වීම දුෂ්කෘත්‍යමය සාධකයක් වී ඇති බව අනාවරණය කළ හැකි ය. එමෙන් ම රාත්‍රී මුර සංචාරක සේවය හේතුවෙන් අඹුසැමි සම්බන්ධතා දුරස්ථ වීම අනියම් සම්බන්ධතා වර්ධනය වීම සඳහා හේතු සාධක වී ඇති බව අධ්‍යයනය මගින් සනාථ විය. හම්බෙගමුව ජනපදයේ පහත සඳහන් කාන්තාවගේ ප්‍රත්‍යේක අධ්‍යයන මගින් මෙම කාරණය ස්ඵුප කළ හැකිවේ.

*නයනා අවුරුදු 40ක් වයසැති හම්බෙගමුව ජනපදයේ ගෘහනියක් වේ. කුටුම්බය තුළ ගෘහ මූලිකයා රාත්‍රී කාලය තුළ කෘෂි වගාවන් ආරක්ෂා කර ගැනීම සඳහා ගෘහයෙන් බැහැර වීමත් ගෘහය තුළ බිරිඳ හා දරුවන් හුදකලාවීමත් ලිංගික ප්‍රේරණයන් ඉටු නොවීමත් නිසා ගැටුම් නිර්මාණය වන බව දක්වයි. ප්‍රාථමික ප්‍රේරණ අවශ්‍යතා කුටුම්බය තුළ සාමාජිකයාගෙන් ඉටු*

*නොවීම අනියම් සම්බන්ධතා වර්ධනය වීම සඳහා පූර්ව සාධක සපයා ඇති බවත් එම නිසා ගෘහස්ත හිංසනයන් අධ්‍යයන ප්‍රදේශය තුළ බහුලව සිදුවන බවත් අනාවරණය විය. කුටුම්බය තුළ අන්තර් සම්බන්ධතා බිඳවැටීම හා ගෘහස්ත ප්‍රචණ්ඩත්වය වර්ධනය සඳහා ඍජු දායකත්වයක් අලි - මිනිස් ගැටුම සිදුකර ඇති බව මැයගේ අදහස තුළින් ගම්‍ය වේ*( ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය අංක 01, 2020/2021**).**

අධ්‍යයන දත්ත අනාවරණය කරන පරිදි මාසික ව මෙවැනි ගැටලු විසඳා ගැනීම සඳහා ග්‍රාම නිලධාරීවරයා වෙත පැමිණිලි 10 - 12ක් වාර්තා වන බව සනාථ කර ගත හැකි විය. මේ හේතුවෙන් ගෘහස්ථ හිංසනය, දික්කසාද වීම හා සියදිවි නසා ගැනීම වැනි බහුවිධ සමාජ ප්‍රශ්න අධ්‍යයන ක්ෂේත්‍රයෙන් අනාවරණය විය. අනාවරිත දත්ත විශ්ලේෂණය කිරීමේ දී මෙවැනි සමාජ ගැටලු නිර්මාණය වීම සඳහා කුටුම්බයේ අන්තර් සම්බන්ධතා බිඳ වැටීම සමුච්චිත කාරණයක් ලෙස දැක්විය හැකි ය. එමනිසා සමාජානුයෝජන කාර්යය නිසි පරිදි සිදු නොවීම හා දරුවන්ගේ පෝෂණය සම්බන්ධ ගැටලු නිර්මාණය වීම දුෂ්කෘත්‍යමය සාධක ලෙස හඳුනා ගත හැකි විය.

අලි - මිනිස් ගැටුම හා ප්‍රජාවන්ගේ මනෝසමාජීය සෞඛ්‍ය බිඳවැටීම අතර ඍජු සම්බන්ධතාවක් පවතින බව අනාවරණය කළ හැකි ය. එය අධ්‍යයන නියැදියට අනුව 22%ක් වේ. මානසික සෞඛ්‍ය බිඳ වැටීම දෛනික ක්‍රියාකාරකම් නිසි පරිදි ඉටු කර ගැනීමේ ගැටලුව හේතුවෙන් කුටුම්බයෙහි කෘත්‍යාත්මක ක්‍රියාවලිය සාධනය කර ගැනීමට නොහැකි වේ. එමෙන් ම සමාජ සම්බන්ධතා ජාලය විධිමත් ව පවත්වා ගෙන යාම සඳහාත් ස්වයංසාධන අවශ්‍යතා ඉටු කර ගැනීමේ දීත් මෙම ප්‍රතිජානාත්මක සම්බන්ධතා බහුසාක්‍යකව නිර්මාණය වීම විශේෂ ලක්ෂණයක් වේ. ආරක්ෂණ යාන්ත්‍රණය බිඳ වැටීම, කුටුම්බ සහයෝගීතාව බිඳ වැටීම, සියදිවි නසා ගැනීම, අපේක්ෂාභංගත්වය හා චිත්තවේගීමය ගැටලු අධ්‍යයන ප්‍රදේශයෙහි මනෝසමාජීය ජනජීවිතය බිඳ වැටීමට හේතු වී ඇති කාරණයන් වේ. මේ හේතුවෙන් ක්ලමථය, විශාදය, වැනි බහුවිධ මානසික රෝග ප්‍රජාවේ වර්ධනය වී ඇති බව අනාවරණය විය.

කුටුම්බයෙහි ආරක්ෂණ යාන්ත්‍රණය ගෘහ මූලිකයා කේන්ද්‍ර කර ගනිමින් සිදු වන අතර අලි - මිනිස් ගැටුම හේතුවෙන් එම ක්‍රියාවලිය ද ව්‍යුත්පන්න වී ඇත. දෛනික කාලයෙන් පැය 10 - 12ක් කෘෂිකාර්මික කාර්යය හා මුර සේවයේ නියුක්ත වීම හේතුවෙන් කුටුම්බයෙහි ස්නේහක හා රැකවරණය කෘත්‍ය බිඳ වැටීමට හේතු වී ඇති බව අනාවරණය විය. මේ හේතුවෙන් පොදු වාසස්ථානය නමැති පවුලේ කාර්යයභාරය වියුක්ත වී ඇති බව දැක්විය හැකි ය. ආරක්ෂණ යාන්ත්‍රණය බිඳ වැටීම හා අලි - මිනිස් ගැටුම අතර ඍජු සම්බන්ධතාවක් පවතින බවත් එම විචල්‍යයවල හැසිරීම හා සහසම්බන්ධතා කුටුම්බ දෛනික ක්‍රියාකාරකම් වියුක්ත කිරීමට නිශේධනීය පසුබිමක් ගොඩනැගී ඇත. ආරක්ෂණ යාන්ත්‍රණය ක්‍රියාත්මක වීමේ දී ආර්ථික ක්‍රියාකාරකම් හා කුටුම්බයේ කාර්යභාරය අතර සමුච්චිත සම්බන්ධතාවක්

පවතින බවත් එම සමුච්චිත සම්බන්ධතාව අලි - මිනිස් ගැටුමේ කේන්ද්‍රීය සාධකයක් බවට පත් වීමත් එම කේන්ද්‍රීය සාධක කුටුම්බයේ පරිධිය සාධක වියුක්ත කිරීමට හේතු වී ඇති බවත් අනාවරණය කළ හැකි ය.

විවාහ සම්බන්ධතා තීරණය කිරීමේ දී විවාහයේ ස්වරූපය කේන්ද්‍රීය සාධකයක් වේ. විශේෂයෙන් ම අන්තර්ජණ්‍ය විවාහ සම්බන්ධතා ලාංකේය සමාජයේ සාධිත සංස්කෘතික ලක්‍ෂණයක් වේ. අධ්‍යයන ක්ෂේත්‍රය තුළ අලි - මිනිස් ගැටුම පාදක සාධකය වීමත් එහෙයින් විවාහයේ පර්යාය සාධක වියුක්ත වීමත් හේතුවෙන් බහිර්ජණ්‍ය විවාහයන් සඳහා නැඹුරුතාව වර්ධනය වී ඇති අතර එය අධ්‍යයන නියැදියට අනුව 19% ක් වේ. කෘෂිකර්මාන්තයත් සමග කෘෂිකර්මාන්තය හා බැඳී පවතින වැඩ කටයුතු සංකීර්ණ වීමත් හේතුවෙන් අඩු වයසින් ප්‍රජනන පවුල ගොඩනගා ගන්නා බව අවිධිමත් සාකච්ඡාවලින් ද සනාථ විය. එහෙයින් කෘෂිකාර්මික කාර්යයන් සඳහා පලපුරුදු හා ඒ සඳහා කාලය කැප කළ හැකි කාන්තාවන් කෙරෙහි විවාහයේ දී අවධානය යොමු කරන බව ප්‍රතිචාරකයන්ගේ අදහස වේ. එහෙයින් විවාහයේ මූලික ප්‍රතිමානික සාධක අවම වීමත් ආර්ථික සාධකය විවාහයේ කේන්ද්‍රීය සාධක බවට පත් වී ඇති බව සනාථ කළ හැකි ය. මේ හේතුවෙන් සමාජ පර්යාය ප්‍රතිසංවිධානය වීමට මෙම විවාහ සම්බන්ධතා හේතු වී ඇති බව අනාවරණය කළ හැකි වේ. විවාහයේ ස්වරූපයේ වෙනස් වීම හේතුවෙන් සාම්ප්‍රදායික විවාහයේ දී සලකා බලන ආරෝපිත සාධක ව්‍යුත්පන්න වී සාධිත සාධක කේන්ද්‍රගත වී ඇති බව අනාවරණය කළ හැකි ය.

කුටුම්බයෙහි අන්තර් සම්බන්ධතා, සංශක්තිය හා අනුකලනය වර්ධනය වීම සඳහා සාමාජිකයන්ගේ ඒකාබද්ධතාව අත්‍යවශ්‍ය වේ. අධ්‍යයන ප්‍රදේශයේ අලි - මිනිස් ගැටුම පාදක සාධකය බවට පත් වී කුටුම්බ අන්තර් සම්බන්ධතාව බිඳ වැටී ඇති බව අනාවරණය විය. ආරක්ෂණ යාන්ත්‍රණය බිඳ වැටීම තත්ත්වාකාර සාධකය ලෙස හඳුනා ගත හැකි ය. කුටුම්බ ගෘහ මූලිකයා හා වැඩිමහල් පිරිමි දරුවන් රාත්‍රී කාලයෙහි වගා ආරක්ෂා කිරීම සඳහා පැල් රැකීම, දෛනික කාලයෙන් වැඩි කාලයක් කෘෂිකාර්මික කටයුතු සඳහා යෙදවීම හේතුවෙන් අන්තර් සම්බන්ධතා බිඳ වැටීමට හේතු වී ඇති බව අනාවරණය විය. එය අධ්‍යයන නියැදියට අනුව 16%ක් වේ. එමෙන් ම ස්නේහය, ආදරය වැනි චිත්තවේගීමය අන්තර් සම්බන්ධතා බිඳ වැටීම හේතුවෙන් කුටුම්බ ක්‍රියාකාරකම් පවත්වා ගෙන යාමේ ගැටලු පැන නැගී ඇත.

## අධ්‍යාපනය අවස්ථාව හා අලි - මිනිස් ගැටුම අතර පවතින ඌනපූරක සම්බන්ධතාව

අධ්‍යයන ප්‍රදේශයේ අධ්‍යාපන අවස්ථා අහිමි වීම හා අලි - මිනිස් ගැටුම අතර ඍජු සම්බන්ධතාවක් දැකගත හැකි විය. මෙම අධ්‍යාපන අවස්ථා අහිමි වීම ප්‍රාථමික අධ්‍යාපන අවස්ථාවන්හි සිට ද්විතීයික අධ්‍යාපන අවස්ථා දක්වා පරාසගත විය. පාසලට දෛනික ව පැමිණීමට අවස්ථාව නොමැති වීමේ සිට අඩු වයසින් පාසල් අධ්‍යාපනය හැර යාම දක්වා

මෙම සංක්‍රාන්තික අවස්ථා අනාවරණය විය. පහත වගු සටහන මගින් මෙය තවදුරටත් සනාථ කළ හැකි ය.

වගු සටහන් අංක 03: *අධ්‍යාපන අවස්ථා අහිමිවීම හා අලි -මිනිස් ගැටුම අතර සම්බන්ධතාවය*

| කාරණය | හම්බෙගමුව | ප්‍රතිශතය | හම්බෙගමුව ජනපදය | ප්‍රතිශතය | සමස්ත ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| පාසලට දෛනික ව නොපැමිණීම | 128 | 66. 0 | 71 | 55.5 | 61.8 |
| පාසල් අධ්‍යාපනය අතරමග නතරවීම | 78 | 40.2 | 28 | 21.9 | 32.9 |
| නියමිත වේලාවට පාසල ආරම්භ නොකිරීම | 151 | 77.8 | 101 | 78.9 | 78.3 |
| අධ්‍යාපන කටයුතු නිසි පරිදි ඉටුකරගත නොහැකි වීම | 103 | 53.1 | 71 | 55.5 | 54.0 |
| ගුරු පුරප්පාඩු | 141 | 72.7 | 81 | 63.5 | 68.9 |

මූලාශ්‍රයඃ- ක්ෂේත්‍ර අධ්‍යයනය, 2020/2021

අධ්‍යයන දත්ත අනාවරණය කරන පරිදි අධ්‍යාපනය අවස්ථා සාධනය කර ගැනීම මගින් උඩුකුරු චලතාවකට විතැන්වීම සඳහා පුද්ගලයාට ඇති අවස්ථා අහිමි වීමක් සිදු වී ඇත. විශේෂයෙන් ම අධ්‍යාපනය මගින් ලබා ගන්නා සාධිත තත්ත්වය අහිමි වීමත් නිර්දේශිත විෂය කරුණු ඉගෙනීමට අවස්ථා අහිමිවීමත් හේතුවෙන් සමාජයේ ස්ථරායන සාධක නිර්මාණය වී ඇති බව අනාවරණය කළ හැකි ය. තෝරා ගත් ග්‍රාම නිලධාරී වසම් දෙකෙහි අධ්‍යාපනය ලබන ළමුන් සඳහා විෂය නිර්දේශිත ආවරණයන් නොලැබීම හා එම විෂය කරුණු ඉගෙනීමට අවස්ථාව හිමි මහා සමාජයෙහි අධ්‍යාපනය ලබන අවශේෂ ළමුන් ස්ථරායනික සාධකය මගින් චලතාවයකට පත්ව ඇති බව අනාවරිත සාධක වේ. එහෙයින් අධ්‍යාපන සාධකය මගින් මෙම ළමුන් අවදානම් සහගත කණ්ඩායමක් බවට පත් වී ඇති බව සනාථ කළ හැකි ය. පාසලට දෛනික ව ළමුන්ට සහභාගී වීමට හැකියාවක් නොමැති වීම හේතුවෙන් දෛනික ව විෂය කරුණු ආවරණය කර ගත නොහැකි වීමත් ඒ හේතුවෙන් නියමිත වර්ෂයට අදාළ විෂය නිර්දේශය ආවරණය කර ගැනීමට නොහැකි වීම අධ්‍යාපනය ලැබීමේ අවස්ථා අහිමි වීමක් වේ. එය මුළු අධ්‍යයනයට අනුව 61.8% වැනි ඉහළ අගයක් වේ.

පාසල් අධ්‍යාපනය විධිමත් ආකාරයෙන් ලබා ගැනීමට නොහැකි වීමත් අධ්‍යාපනය අතරමග නතර වීමත් අතර සහසම්බන්ධතා රටාවක් නිර්මාණය වී තිබේ. නියමිත අධ්‍යයන වර්ෂයට අදාළ විෂය නිර්දේශය ආවරණය නොවීමත් විෂය ඉගැන්වීම සඳහා විධිමත් ආචාර්ය මණ්ඩලයක් නොමැති වීමත් හේතුවෙන් පාසල් අධ්‍යාපනයෙන් පුද්ගලයෙක් විතැන් වීම සිදු

විය හැකි ය. මේ හේතුවෙන් අනාගතයේ දී සාධිත තත්ත්වය ගොඩනගා ගැනීමට පවතින අවස්ථා අහිමි වීමක් සිදු වේ. රාමු අංක 03හි සඳහන් කේන්ද්‍රගත සම්මුඛ සාකච්ඡාව මගින් මෙම කාරණයන් සනාථ කළ හැකි ය.

රාමු අංක 03

කේන්ද්‍රගත සම්මුඛ සාකච්ඡා අංක 03 - ස්ත්‍රී පුරුෂ සම්මිශ්‍රිත තරුණ ප්‍රජාව, හම්බෙගමුව ජනපදය

*මේ ගමේ ගොඩක් ළමයි සාමාන්‍ය පෙළවත් කරන්නේ නැහැ. මොකද හරිහමන් ගුරුවරයෙක් මේ ගමේ ඉස්කෝලෙට එන්නෙත් නැහැ. ආවත් මාසයක් විතර ඉදලා අස්වෙලා යනවා. සමහර විෂයන් උගන්වන්න ගුරුවරු ඇත්තෙත් නැහැ. සමහර විෂයන් පාසලේ ඇත්තෙත් නැහැ. එකම ගුරුවරයා විෂයන් තුනක් හතරක් උගන්වනවා. මෙහෙ ම වෙනකොට ළමයින්ට පාසල් අධ්‍යාපනය එපා වෙනවා. ඒක නිසා ගොඩක් අය පාසල් අධ්‍යාපනයට කලින් ම සමුදෙනවා. ඉතා ම අඩු පිරිසක් තමයි සාමාන්‍ය පෙළවත් කරන්නේ. මේ ප්‍රශ්නය ගැහැණු පිරිමි ළමයි ඔක්කෝ ම අතර තියෙනවා. පහුගිය අවුරුදු 3ක් තිස්සේ මේ ගමේ ගොඩක් ළමයි සාමාන්‍ය පෙළවත් කළේ නැහැ. එහෙම කරත් කරන්නේ ළමයි 7 - 8ක් විතර යි. ඒ ළමයිගෙනුත් එක්කෙනෙක් දෙන්නෙක් ඇර අනෙක් ළමයි පාස්වෙන්නේ නැහැ. මේක මේ ගමේ ළමයින්ට අත්වෙච්ච මහ කරුම ඉරණමක්. ඊට පස්සේ ළමයි ගාමන්ට් නැත්නම් හේන්වල වැඩ කරන්න යනවා. නැත්නම් අඩු වයසින් කසාද බැඳගෙන මහ දුක් කරදරත් එක්ක ජීවත් වෙනවා. මේ ඉරණම අත්වෙලා තියෙන්නේ මේ අලි ප්‍රශ්නය නිසා තමයි. සමහර ළමයි පාසල් යන්නෙත් ආවට ගියාවට. මොකද ඒ ළමයින්ට ඉගෙනගන්න ඕනකමක්වත් ඒ සඳහා දෙමාපියන්ගේ පෙලඹවීමක්වත් නැහැ. සමහර ළමයි ඉස්කෝලේ යන්නේ මාසයකට දවස් දෙක තුනක් විතරයි. ඒකට හේතුව තමයි මේ අලි ප්‍රශ්නය. මොකද පාසලට උදෙන් යන්න පිටත් වුණත් යන මග දෙතුන් පලක අලි ගැවසෙනවා. ඒක නිසා දෙමාපියොත් බයයි ළමයි යවන්න. ළමයිගෙත් මේක නිසා උනන්දුවක් නැහැ. පාසලේ වාර විභාගයටවත් යන්න ළමයි බයයි ඒක නිසා ළමයි 7, 8 පන්තිවලින් පාසල් ගමන නවතා දමනවා.*

මූලාශ්‍රය : ක්ෂේත්‍රීය අධ්‍යයනය, 2020/2021

අලි- මිනිස් ගැටුම අධ්‍යයන ප්‍රදේශය තුළ පාසල් පැවැත්වීමේ කාල පරිච්ඡේදයන් වියුක්ත කිරීමට හේතු වී ඇති අතර එය අධ්‍යයන නියැදියට අනුව 78.3 % (252) ක් වේ. පාසල් කාලය පැය 6කට සීමා වුවත් එම නියමිත පැය 6 කාල සීමාවේ දී පාසල නොපැවැත්වීම හේතුවෙන් විෂයික කාරණා ආවරණය කර ගැනීම, ක්‍රීඩා අභ්‍යාස කටයුතු පැවැත්වීමේ ගැටලු හා වෙනත් කුසලතා පූර්ව වැඩසටහන් පැවැත්වීමේ අවස්ථා අහිමි වීම නිසා අධ්‍යාපනයෙන් අපේක්ෂිත පරිපූර්ණ පුද්ගලයෙක් නිර්මාණය කිරීමේ අවස්ථා විරල වී ඇත. එය අධ්‍යාපන

අවස්ථාවලින් ශිෂ්‍යයන් ආන්තීකරණයකට ලක්වීමක් වේ. ශිෂ්‍යයන් අධ්‍යාපනය තුළින් ආන්තීයකරණයට ලක්වන ආකාරය රාමු අංක 04 හි සඳහන් කේන්ද්‍රගත සම්මුඛ සාකච්ඡාව මගින් සනාථ කළ හැකි ය.

| රාමු අංක 04<br>කේන්ද්‍රගත සම්මුඛ සාකච්ඡා අංක 04 - පුරුෂ තරුණ ප්‍රජාව, හම්බෙගමුව |
|---|
| *අපේ ගමේ තියෙන පාසල් දැන් වෙනකොට වෙලාවට පටන් ගන්න බැරි වෙලා තියෙනවා. මොකද පාසල් වත්තෙත් අලි රංචු පිටින් ඉන්නවා. ඒ වගේ ම ගමේ ළමයි යන පාරවල්වලත් මේ අලි සැරිසරනවා. මොකද පහුගිය කාලේ ඉස්කෝලෙට එන්න ඇවිල්ලා ළමයි මේ උවදුරට මුහුණ දීලා මැරිලා තියෙනවා. යාලෙන්, උඩවලවෙන් එලවන ගොඩක් අලි අවසානයේ දී මේ ගම්වලට තමයි එන්නේ. ඒ විතරක් නොවෙයි අපි ඉස්සෙල්ලා කියපු ඉස්කෝලවල ගොඩනැගිලි කඩලා, සමහර වගාවන් විනාශ කරලා තියෙනවා. ඒවගේ ම පුස්තකාලේ එහෙමත් කඩලා දාලා තියෙනවා. සමහර පාසල් පටන් ගන්නේ කොටස් දෙකකට බෙදලා. උදේ වරුවේ 6 ශ්‍රේණියේ ඉඳලා 11 පන්තිය දක්වා. අනෙක් වසරවල් පටන් ගන්නේ හවස් වරුවේ. මේ තත්ත්වයත් හරිම අවදානම්. මොකද හවස 3.00 - 4.00 වෙද්දී අලි එහා මෙහා මාරුවෙනවා.*<br><br>මූලාශ්‍රයඃ ක්ෂේත්‍රීය අධ්‍යයනය, 2020/2021 |

දෛනික පාසල් කාල පරිච්ඡේද නියමිත පරිදි පවත්වා ගෙන යාමේ ගැටලුව හා අලි - මිනිස් ගැටුම අතර ඍජු සම්බන්ධතාවක් පවතින බව මෙම සම්මුඛ සාකච්ඡාව මගින් අනාවරණය වේ. විශේෂයෙන් ම දෛනික කාලය හා ළමුන්ගේ පාසල් අධ්‍යාපන කටයුතු ආරම්භ කිරීම අතර කාල පරාසය ගැටුමේ තීව්‍ර සාධක ඉස්මතු වී පවතින බව සනාථ කළ හැකි ය. භෞතික වත්කම් විනාශ වීමත් ළමුන් සඳහා අධ්‍යාපනය ලැබීමට අවශ්‍ය මූලික පහසුකම් නොලැබීමත් හේතුවෙන් අධ්‍යාපන සාධකය මගින් ආන්තීකරණයට ලක් වී ඇත. මෙම ආන්තීකරණ සාධකය භෞතික පහසුකම් ලැබීමේ සිට ඒවා පරිහරණය කිරීමට ඇති අවස්ථාව මග හැරීම දක්වා පරාසගත වී ඇති බව සනාථ කළ හැකි ය. එමෙන් ම මානව ජන ජීවිතය හා දෛනික පාසල් ආරම්භ කිරීම අතර සහසම්බන්ධතාවක් නිර්මාණය වී ඇති අතර එය පුද්ගලයාගේ ජීවිත හානි වර්ධනය කිරීම දක්වා පරාසගත වී ඇති බව අනාවරණය වේ. මෙම සාධක පිළිබඳ විශ්ලේෂණය කිරීමේ දී කාලය හා සත්ව සංචරණය අතර පවතින සංක්‍රාන්තික කාලය පාසල් අධ්‍යාපනය සඳහා යෙදවීම හේතුවෙන් නිශ්චිත කාලයේ දී පාසල් අධ්‍යාපනය අඛණ්ඩ ව පවත්වා ගෙන යාමේ ගැටලුවක් නිර්මාණය වී ඇති බව සනාථ කළ හැකි ය. මේ සාධකය ඍජු ව ම පාසල් අධ්‍යාපනයෙන් ශිෂ්‍යයා ව්‍යුත්පන්න වීමට හේතුවක් වේ.

## ගැටුම සඳහා පදනම් වී ඇති පූර්ව සාධක හා එම ගැටලු වර්ධනය වීමට බලපා ඇති සාධක

අධ්‍යයන ප්‍රදේශයේ මානව සත්ව ගැටුම ව්‍යවහාරික දිග්ගැස්සුණු ප්‍රකට සමාජ ගැටුමක් බවට පත් වී ඇති අතර පරිසර සාධක, මානව හා සත්ව අවශ්‍යතා අසමපාතික වීම පූර්වෝක්ති සාධක වේ. පරිසර සම්පත් තුලනය කිරීමකින් තොර ව අසීමිත අවශ්‍යතා හා එම අසීමිත අවශ්‍යතා ගැටුම් පාර්ශ්වය සඳහා සාධාරණ ලෙස නොබෙදී යාමත් මානව කේන්ද්‍රීයකරණයට ලක් වීමත් නිසා දිග්ගැස්සුණු සමාජ ගැටුමක් බවට පත්වී ඇත. මෙම සමාජ ගැටුම සමථනය සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග අසමමිතික වීම ගැටුම තීව්‍ර වීමට පසුබිම සපයා ඇත. එහෙයින් අධ්‍යයන ප්‍රදේශයේ ගැටුම සඳහා පාදක වු සාධක හා එම ගැටලු වර්ධනය සඳහා බලපා ඇති හේතු සාධක පහත පරිදි අනාවරණය විය.

1. අවිධිමත් රාජ්‍ය සැලසුම්කරණය හා අලිමංකඩ ආශ්‍රිත ව නව නිවාස ගොඩනැගීම

ගැටුමේ පූර්වෝක්ත සාධක හා එම සාධකවලට අනුගත පරිදි සැලසුම් ක්‍රමයක් ක්‍රියාත්මක නොවීමත් ගැටුමේ ප්‍රකට කාරණා හඳුනා ගනිමින් විසඳුම් ක්‍රියාවලියක් අනුගමනය කිරීම මත මෙම ගැටලුව සමාජගත වී ඇත. විශේෂයෙන් ම අලි වෙඩි ලබා දීම, අලි කොලිඩෝ සකස් කිරීම හා අලි වැට යාවත්කාලීන කිරීමෙන් කෙටි කාලීන විසඳුම් ක්‍රියාවලියකට අවශ්‍ය ක්‍රියාමාර්ග සකස් කිරීම සිදු කළත් ඒවා නියාමනය හා පසු විපරම් කිරීම සඳහා දිගුකාලීන ක්‍රමවේදයක් සකස් නොකිරීම රාජ්‍ය සැලසුම්කරණයේ දුර්වලතාවක් වන බව අනාවරණය විය. මේ හේතුවෙන් සැලසුම්කරණය නිලධාරීවාදය මත පදනම් වීමත් නිලධාරීවාදය පෞද්ගලීකරණය වීමත් හේතුවෙන් ගැටුම දිග්ගැස්සුණු සමාජ ගැටුමක් බවට පත් වී ඇත. එමෙන් ම අභයභූමි හා ඉඩම් පනත උල්ලංඝනය කිරීම මගින් මානව අවශ්‍යතා සඳහා ප්‍රමුඛත්වයක් ලබා දීම හේතුවෙන් ගැටුම වර්ධනය වීමට සාධක නිර්මාණය වී ඇති බව අනාවරණය විය. රක්ෂිත හා අලීන්ගේ නිජබිම් ආශ්‍රිත නිවාස හා ගොඩනැගිලි ඉදි කිරීම ඒ සඳහා රාජ්‍ය අංශය මගින් විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය නොකිරීම හේතුවෙන් සත්ව ප්‍රජාව ගැටුම තුළ ආන්තීයකරණයට ලක් වී ඇත. මේ හේතුවෙන් රාජ්‍ය සැලසුම්කරණය තාවකාලික සමථනයකට වඩා දිගුකාලීන සමථන හා විසඳුම් ක්‍රියාවලියකට අනුගත කිරීම අත්‍යවශ්‍ය කාරණයක් වේ.

2. දියුණු තාක්ෂණික ක්‍රම භාවිතයේ පවතින ඌනනය හා සේවක පුරප්පාඩු නොවිසඳීම

වන සතුන්ගෙන් වන හානි සඳහා ලෝකයේ රටවල් විවිධ ක්‍රමෝපාය භාවිත කිරීමත් එම ක්‍රමෝපාය සතුන්ට හා මිනිසාට හානි නොවන හිතකර ක්‍රම වීමත් හේතුවෙන් මෙම ගැටුම් සමථකරණයට ලක් වී ඇත. විකර්ෂක (Repellents) භාවිතය (ජුගුප්සාජනක ගන්ධයක් ඇති රසායනික ද්‍රව්‍යයක) අවධාරිත ආලෝකය භාවිතය, විදුලි පන්දම් ආලෝකය, උණ බම්බු වෙඩි දැල්වීම මගින් වන සතුන් මෙල්ල කිරීමේ තාක්ෂණික ක්‍රම ලෝකයේ රටවල් (ඉන්දියාව,

සිම්බාබේ) අනුගමනය කරන බවත් එය ගැටුම් සඳහා සාධනීය උපක්‍රමයක් වී ඇති බවත් ප්‍රතිචාරකයන්ගේ මතය වේ. ඒ මගින් වගා බිම් ආරක්ෂා කර ගැනීමේ ශක්‍යතාවක් පවතින බව අනාවරණය විය. එමෙන් ම රාත්‍රී මුර සේවයේ සහ අලි වැට ඉදි කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන් සීමිත වීමත් නිලධාරීන් බහුවිධ කාර්යයන්වල නිරත වීමත් හේතුවෙන් සමථන ක්‍රියාවලිය සාර්ථක ව පවත්වා ගෙන යාමේ ගැටලුවක් පවතින බව කේන්ද්‍රගත සම්මුඛ සාකච්ඡා මගින් සනාථ විය.

3. අලිවැට හා අගල් යාවත්කාලීන නොකිරීම

වන අලීන් ප්‍රවේශ වන මාර්ගයන්හි තාවකාලික විදුලි වැට හා අගල් යාවත්කාලීන නොකිරීම හේතුවෙන් කෘෂිකාර්මික වගා හා අස්වැන්න ආරක්ෂා කර ගැනීමේ ගැටලුවක් නිර්මාණය වී ඇත. අගල්වල මඩ තැන්පත් වීම, විදුලි වැට ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ ක්‍රියාකාරීත්වය අවම වීම හේතුවෙන් ජීවිත, දේපොළ හා වගා බිම් ආරක්ෂා කරගැනීමේ ගැටලු අධ්‍යයන ප්‍රදේශයේ දී අනාවරණය විය. ප්‍රජා සංවර්ධන ක්‍රියාවලි සඳහා පුද්ගලයාගේ සහභාගීත්වය අවම වීම, නිලධාරීන් හා ප්‍රජාව අතර ගැටුම් නිර්මාණය වී තිබීම හා ප්‍රජා සජීවීකාරකයන්ගේ කාර්යයන් සඳහා ප්‍රජාවගේ සහයෝගය අවම වීම හේතුවෙන් මෙම ගැටලුව සමාජගත වී ඇති බව අනාවරණය විය.

4. වනාන්තරවල වන සතුන් සඳහා ආහාරපාන හිඟ වීම

රක්ෂිත වගාබිම් බවට පත්වීම, නිවාස හා ගොඩනැගිලි ඉදි කිරීම හේතුවෙන් මෙම ගැටලුව අධ්‍යයන ප්‍රදේශයේ දී අනාවරණය විය. රක්ෂිත වගා කටයුතු සඳහා යෙදවීම, සාම්ප්‍රදායික අභිචාර විධි (කුරුලු පාළුව, සතුන් සඳහා වගාවන්ගෙන් කොටසක් අතහැරීම) අනුගමනය නොකිරීම හේතුවෙන් සතුන් වගා බිම් හා ගම්මානවලට ප්‍රවේශ වන බව ප්‍රතිචාරකයන්ගේ අදහස විය. මේ හේතුවෙන් වනාන්තර හා අභයභූමිවල වන සතුන්ගේ දෛනික ආහාර සපයා ගැනීමට නොහැකි වීමත් ආහාර හිඟ වීමත් හේතුවෙන් වගා විනාශ කරමින් ආහාර සපයා ගැනීමට පෙලඹේ. අක්‍රමවත් වන වගා හා අනවසර බෝග වගා, වන අලි සංරක්ෂණයේ පවතින දුර්වලතා, අලියා මිනිසාට හුරු වීම, කාලගුණික හා දේශගුණික විපර්යාසවල බලපෑම හා දේශීය කෘෂි ආර්ථිකය බිඳ වැටීම හා නවීන වගා සඳහා ගොවීන් පෙලඹීම ගැටුම සඳහා පාදක සෙසු සාධයෝ වෙති.

## ගැටුම අවම කිරීම සඳහා මෑත කාලීන ව ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ඒවා අසාර්ථක වීමට බලපා ඇති සාධක

වගු සටහන් අංක 03: *අලි - මිනිස් ගැටුම අවම කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග හා ඒවා අසාර්ථක වීමට බලපා ඇති හේතු කාරණා*

| අනු අංකය | ක්‍රියාමාර්ග | අසාර්ථක වීමට බලපා ඇති හේතු |
|---|---|---|
| 01. | විදුලිවැට ඉදිකිරීම | අන්තර් පුද්ගල හා අන්තර් ආයතනික සම්බන්ධතා බිඳවැටීම |
| 02. | ඉඩම් ආවරණය වන පරිදි ආරක්ෂිත වැට ඉදිකිරීම | එක් සිද්ධියක් අදාළ කරගනිමින් තීරණ ක්‍රියාත්මක කිරීම |
| 03. | ආරක්ෂිත කාණු ඉදිකිරීම | නිලධාරීකරණය |
| 04. | අලිවෙඩි ලබාදීම | ප්‍රමාණවත් පහසුකම් නොමැතිවීම |
| 05. | අලීන් අභයභූමිවලට මුදා හැරීම | නිලධාරීන්ගේ රාජකාරිය නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම |
| 06. | කුඩා පොකුණු ඉදිකිරීම | |
| 07. | දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | |

මූලාශ්‍රයඃ- ක්ෂේත්‍ර අධ්‍යයනය, 2020/2021

අධ්‍යයන දත්ත අනාවරණය කරන පරිදි ගැටුම දීර්ඝ කාලීන සමථනයකට අවශ්‍ය ක්‍රියාමාර්ග සකස් කිරීමට වඩා තාවකාලික විසඳුම් ක්‍රියාවලියක් මගින් ගැටුම සමාජගත වීම වැළැක්වීමට කටයුතු කර ඇත. ගැටුම් පාර්ශ්වයේ අවශ්‍යතා, දුක්ගැනවිලි, අගනාකම් හා අන්තර් පරායත්තතාව අතර සමුච්චිත සම්බන්ධතාවක් නොමැති වීමත් එම සම්බන්ධතා ජාලය ගැටුම් පාර්ශ්වයන්ගේ ප්‍රතිලාභ අතර තුලනය නොවීම වියනුකලන සම්බන්ධතාවක් ගොඩනැගීමට පසුබිම් සාධක නිර්මාණය කර ඇති බව අනාවරණය විය. මේ හේතුවෙන් ගැටුමේ ප්‍රතිලාභ ගැටුම් පාර්ශ්ව අතර සමපාත නොවීම විසඳුම් ක්‍රියාවලිය අසාර්ථක වීම සඳහා නිලීන කාරණන් වේ.

## නිගමන හා අනාවරණ

මෙම අධ්‍යයනය තේමා පහක් යටතේ විශ්ලේෂණය කිරීම සිදු කළ අතර එම විශ්ලේෂිත දත්ත අනුව අලි - මිනිස් ගැටුම අධ්‍යයන ප්‍රදේශයේ දිග්ගැස්සුණු සමාජ ගැටුමක් බවට පත් වී ඇති බව අනාවරණය කළ හැකි ය. විශේෂයෙන් ම අවශ්‍යතා හා අනන්‍යතා සාධක ගැටෙන පාර්ශ්ව අතර අසමමිතික ව බෙදී යාමත් එම අසමමිතික සම්බන්ධතාව දුක්ගැනවිලි ලෙස සමාජගත වීමත් හේතුවෙන් දිග්ගැස්සුණු සමාජ ගැටුමේ සංරචක ශක්තිමත් කිරීමට අවශ්‍ය සාධනීය සාධක නිර්මාණය වී ඇති බව සමස්ත ගැටුම් විග්‍රහය මගින් සනාථ කළ හැකි ය. මේ හේතුවෙන් ගැටුමේ ප්‍රකට කාරණා සහවේදීය දෘෂ්ටියකින් අනාවරණය වුවත් ගැටුමේ පූර්වෝක්ත සාධක හා දේශීය කෘෂිකර්මාන්තය ව්‍යාපාරික කෘෂිකර්මාන්තයක් බවට පත් වීමත් නව සංස්කෘතික අනුවර්තන පරිසරයක් අධ්‍යයන ප්‍රදේශයේ නිර්මාණය වීම ගැටුම් විශ්ලේෂණ පර්යාය නව වෙනසියාවකට ලක් කිරීමක් වේ. මේ හේතුවෙන් සංස්කෘතික ප්‍රතිමාන ගැටුම් සාධකය සමග ප්‍රතිව්‍යූහගත වීම ගැටුම්වාදී විශ්ලේෂණයට නව ආකෘතියක් සපයා ඇති බව සනාථ කළ හැකි ය. ගැටුම සමස්ත සමාජයේ සමාජ ව්‍යූහයන්ගේ නව සංස්කෘතියක් ඇති කිරිමට පසුබිම් සාධක සපයා ඇති බව අනාවරිත දත්ත මගින්

විශ්ලේෂණය කළ හැකි වේ. විශේෂයෙන් ම ග්‍රාමීය අංශයේ තරගකාරීත්වය ආර්ථික සාධකය සමග ආකලිත වීම ප්‍රතිවාදික දෘෂ්ටියකින් හඳුනා ගත හැකි වීම අධ්‍යයනයේ සුවිශේෂීතාවක් වේ. එම සුවිශේෂීතාව ගැටුමට මුහුණ දෙන කුටුම්බ ක්‍රියාකාරීත්වයේ ප්‍රාථමික, ද්විතීයික අවශ්‍යතා පූරණය සඳහා ප්‍රතිජානාත්මක සම්බන්ධතාවක් නිර්මාණය කර ඇති අතර සාධිත තත්ත්වය තුළ අනාගත භූමිකා බිඳ වැටීමට හේතු වී ඇත. අධ්‍යාපන අවස්ථා සඳහා දෛනික කාලය කෙටි වීම, කෙටි කාලය හා අධ්‍යාපනයේ පරිසාධන මට්ටම අතර පරතරය හීන වීම යන සාධක ස්වයංසම්මානිත අවස්ථා අහිමි කිරීමක් වේ. මේ හේතුවෙන් අධ්‍යාපන අවස්ථා අතර කාලය හීන වීම පුද්ගලයා අධ්‍යාපන අවස්ථා මගින් ආන්තීයකරණයට ලක් කර ඇත. ප්‍රකට කෘත්‍ය පාසල් කාලය කෙටි කාලීන වීමත් එම කෙටි කාලය සේවා නියුක්තිකයෙක් බවට පුද්ගලයා පත් වීමටත් හේතු වී ඇති බව අනාවරණය වේ. විශේෂයෙන් ම පාසල් ශිෂ්‍යයා සංචාරක ශිෂ්‍යයකු (Travel Student) ලෙසත් පාසල් ගුරුවරයා සංචාරක ගුරුවරයෙක් (Travel Teacher) බවටත් පත් වී ඇත.

කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය මාර්ග බවට පත් වුවත් සශ්‍ය මාරු වීම් සඳහා දක්වන මැලිකම සත්ව ප්‍රජාව වගාවන් සඳහා ආකර්ෂණය වීමට හේතු වී ඇති බව අනාවරණය කළ හැකි ය. ලාභය නමැති සාධකය හා පරිසරය වගාවට හුරු වීම විනා වගාව පසට හුරු කිරීම ශස්‍ය මාරුව මගින් වගාවල විවිධාංගීකරණයන් ඇති කිරීමට ප්‍රජාව නැඹුරු වූයේ නම් ගැටුම විපරිවර්තනය කිරීමට හේතු සාධක සැපයිය හැකි ය. මේ හේතුවෙන් සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයේ දී කෘෂි ගොවි පවුල ලාභ ඉපයීමේ කෘෂි ගොවි පවුලක් වී ඇති බව අනාවරණය කළ හැකි ය. නූතනත්වය තුළ ආදායම්යන්හි සචලතාව හා ණය ලබා ගැනීම අතර සහසම්බන්ධතා රටාව පිළිබඳ විමසීමේ දී ස්තර නිර්මාණය වීමත් එම ස්තර ආදායම් අවශ්‍යතාව (Need) හා ඒකාබද්ධතාව (Solidaraty) මත නිර්මාණය වී ඇති බවත් නිගමනය කළ හැකි ය. එය කුටුම්බයේ අවශ්‍යතාවන්ගේ ඌනපූරකයන් වී ඇත.

මනෝ සාමාජීය ගැටලු හා අලි - මිනිස් ගැටුම අතර ද්වන්ද්වාත්මක සම්බන්ධතාවක් අනාවරණය වේ. තත්ත්වයට හිමි කාර්ය කොටස විභේදනය වීම භූමිකා ගැටුම හා තත්ත්ව කුලකය අවරෝධනය වීම අලි - මිනිස් ගැටුමේ ප්‍රකට හා නිලීන ලක්ෂණ වේ. මෙම ගැටුම බිඳුණු පවුල් නිර්මාණය වීමටත් අන්තර් සම්බන්ධතා බිඳවැටීමත් හේතු වී ඇති අතර මනෝ සාමාජීය සෞඛ්‍ය පිරිහීමට හේතු කාරණා වේ. විශේෂයෙන් ම ගෘහ කුටුම්බයේ ආදායම් උත්පාදකයා හා ගෘහිණියගේ කාර්යභාරය ගැටුම හේතුවෙන් අහිමි වීම සමස්ත කුටුම්බයේ භූමිකා ගැටුමට හේතු වී ඇත. එය කුටුම්බයේ ඒකාබද්ධතාව බිඳ වැටීමට අවශ්‍ය ප්‍රධාන සංරචකයක් වී ඇති බව අනාවරණය කළ හැකි වේ. එහෙයින් ගැටුමේ තත්ත්වාකාර හා නිලීන සාධක අනුවර්තනීය සමාජ ක්‍රමයකට පුද්ගලයා හුරු කිරීමේ සාධකයක් වී ඇති බව සනාථ කළ හැකි ය. දිග්ගැස්සුණු සමාජ ගැටුමෙහි අන්තර්ගත එක් අවස්ථාවක ප්‍රචණ්ඩකාරීත්වයක් ද තවත් විටෙක සැඟවුණු ලක්ෂණ ද යන කාරණය ගැටුමේ සනාථ

සාධක වී ඇත. එහෙයින් ගැටුම්වාදී විශ්ලේෂණයට අවශ්‍ය පසුබිම් සාධක අධ්‍යයන දත්ත මගින් සනාථ කර ඇත.

බහුමානික ප්‍රවේශය හා බහු ආංශික සම්බන්ධතා රාජ්‍ය අංශය හා ග්‍රාමීය ප්‍රජාවෙහි විරල වීමත් සාම්ප්‍රදායික අභිචාර විධි සමග අනුගත වීමට පවතින අකමැත්ත සමස්ත අධ්‍යයන ප්‍රදේශයේ ගැටුම සමාජගත වීමට හේතු වී තිබේ. මේ හේතුවෙන් ආයතනික හා ප්‍රජා කාර්යභාරය අතර පවතින සට්ටනීය සම්බන්ධතාව විසඳුම් ක්‍රියාවලියක් මගින් සමථනයකට වඩා ආංශික ප්‍රවේශයක් මගින් බලගැන්වීම අත්‍යවශ්‍ය කාරණයක් වේ. එහෙයින් පුද්ගලයා, පවුල, ප්‍රජාව හා සමාජය අතර අනුකලිත සම්බන්ධතාවක් නිර්මාණය කිරීම දිගුකාලීන සමථකරණයේ ප්‍රතිලාභ ලබා ගැනීමේ ධනාත්මක කාරණයෝ වෙති.

## ආශ්‍රේය ග්‍රන්ථනාමාවලිය


අබේගුණවර්ධන, පි., සේනාරත්න, ඒ. (2002). *ස්වභාවික සම්පත් හා පරිසර ආර්ථික විද්‍යාව.* කැස්බෑවඃ ඉමදුවගේ ක්‍රියේෂණ්.

ආරියදාස, ඩී. (2002). *මිනිසා සහ පරිසරය.* මහරගමඃ තරංජී ප්‍රින්ටර්ස්.

ආරියසේන, එස්. (2004). *ගෝලීයකරණය සොබාදහම සහ මානව සංහතියේ ඉරණම.* කර්තෘ ප්‍රකාශනයකි.

කරුණාදාස, ඩබ්.එම්. (2003).*ගැටුම් නිරාකරණයට හැඳින්වීමක්* . දෙහිවලඃ ඉමේජ් ලංකා ප්‍රකාශකයෝ.

ගුණසේකර, යු. (2011 අගෝස්තු). මානුෂීය මෙහෙයුමකින් අලි මිනිස් ගැටුම විසඳමු. *විදුසර.* කොළඹඃ උපාලි පුවත්පත් සමාගම.

ජයකොඩි, එස්. කේ. (2007). *තිරසාර සංවර්ධනයඃ සංකල්පනාත්මක න්‍යාය සහ ව්‍යාවහාරිකත්වය.* කැළණියඃ කැළණිය විශ්වවිද්‍යාලය.

ද සිල්වා, ඒ. (2001). *සමාජ විද්‍යා පර්යේෂණ ක්‍රමවේදය.* කතෘ ප්‍රකාශන.

ද සිල්වා, පී. කේ. (2010). *ශ්‍රී ලංකාවේ වල් අලීන්ගේ අද තත්ත්වය, අලි සංරක්ෂණය සහ මිනිස් අලි ගැටුම ඌනනය කිරීම.* පේරාදෙණිය විශ්වවිද්‍යාලයඃ සත්වවිද්‍යා අධ්‍යයනාංශය.

ධනපාල, ඒ. එච්. (2006). *පාරිසරික භූගෝල විද්‍යාව, පරිසර දූෂණය හා ජෛව විවිධත්වය.*මහරගමඃ තරංජී ප්‍රින්ටර්ස්.

ප්‍රනාන්දු, ඩබ්. එම්. (2005). *පුද්ගල ගැටුම් සමථකරණයට ක්‍රියාවලිය.* වරකපොලඃ ආරිය ප්‍රකාශකයෝ.

*මහබැංකු වාර්ෂික වාර්තාව.* (2019). කොළඹඃ මහබැංකු වාර්ෂික ප්‍රකාශනයකි.

විතාරණ, ටි., චන්ද්‍රසේකර, කේ. (2012). *ගැටුම් නිරාකරණය.* කොළඹඃ සමුද්‍ර පොත් ප්‍රකාශකයෝ.

තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සැලසුම් අංශය (2019). *සම්පත් පැතිකඩ වාර්තාව.* තණමල්විලඃ තණමල්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

හෙට්ටිආරච්චි, ජේ. (2000). *පාරිසරික භූගෝල විද්‍යාව(පරිසරයේ මූලික මූලිකාංග).* කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Azar, E. (1990). *The Management of Protracted Social Conflict: Theory and Cases*.Aldershor: Dratmouth.

Babbie, E. (2004). *The Practice of Social Research*.(10th Ed). Belmont: Wardsworth /Thomson Lerning.

Bandara, R. (2002a). *Willingness to pay for Conservation of the Asian Elephant in Sri Lanka: A Contingent Valuation Study*. Research gate.net.

Bandara. R. (2005b). *The Economics of Human-Elephant Conflict*. Battaramulla: Ministry of Environmental and Natural Resource.

Boulding, K. (1962). *Conflict and Defence: A General Theory*.New York: Oxford University Press.

Chambers, R. (1983). *Rural Development: Putting the Last First*. Longman: Haslow.

Cunnigham, P., William, T., & Saigo., B. (1993). *Environment Science*. A Giddle Concern: WCD Publication.

Craves, J., Reavey, D. (1996). *Globle Environment Change*.Longman: Sage Publication.

Dharmaratne, M. P. J., & Magedaragamage, P. C. (2014). *Human elephant conflict and solutions to it in Sri Lanka*. Sciscitator, 1, 56-58. https://doi.org/10.1037/edu0000396

Ekanayaka, S. K. K., A. et al., (2011). Patterns of Crop Raiding by Asian Elephants in a Human-Dominated Landscape in Southeastern Sri Lanka. *Gajah* 34: 20–25.

Fernando, P. et al., (2011). *Current Status of Asian Elephants in Sri Lanka*. Gajah 35, pp. 93-103.

Fernando, P., Jayewardene, J. Prasad, T. Hendavitharana, W. & Pastorini, J. (2011). Current status of Asian elephants in Sri Lanka. *Gajah* 35: 93–103.

Galtung, J. (1975). *A Structural Theory of Aggression. Journal of Pease Research* (Volume 01). Copenhangen: Christian EJ lers.

Gunawardhana, L.M.A.P., & Herath, N.S.K. (2018). *An analysis of human – elephant conflict of disaster. A case study in Anuradhapura district of Sri Lanka*. .https://www.researchgate.net/publication/328359673_

International Research Institute for Climate and Society. (2005). *Climate Influences on Human Elephant Conflict in Sri Lanka.* US: Columbia University

Maxwell, J. A. (1996). *Qualitative Research Design*. Thousand Oaks. CA; Sage Publication.

Perera, B., Oswin. M. A. (2009). The Human-Elephant Conflict: A Review of Current Status and Mitigation Methods. *Gajah* 30: 41–52.

Pruitt, D., and Rubin, J. (1986). *Social Conflict: Escalation, Stalemate and Settlement*. New York: Random Houses.

Santiapillai, C., Wijeyamohan, S., Bandara, G., Athurupana, R., Dissanayake, N., & Read, B. (2010). An assessment of the human-elephant conflict in Sri Lanka. *Ceylon Journal of Science* (Biological Sciences). 39(1):21-23. https://doi.org/10.4038/cjsbs.v39i1.2350

Santiapillai, C. (1996). *Mitigation of Human conflict in Sri Lanka.* https://pubs.iied.org/sites/default/files/pdfs/migrate

Yeo, J., & Neo, H. (2010). *Monkey Business: Human-Animal Conflicts in Urban Singapore*. Social and Cultural Geography 11: 7, 681–699. https://doi.org/10.1080/14649365.2010.508565